| **එකතුව ( ඇ )** | | | **10,500,000.00** | - | **(2,377,000.00)** | **8,123,000.00** | **7,666,162.68** | - | **7,666,162.68** | **456,837.32** | | |
| | | | | | | | | | | | | |
| සේවා | | | | | | | | | | | | |
| 1401 ප්‍රවාහන | | 11 | 3,000,000.00 | | (1,000,000.00) | 2,000,000.00 | 1,735,483.87 | | 1,735,483.87 | 264,516.13 | 13.23% | ප්‍රධාන ඉංජිනේරු හා සැලසුම් අධ්‍යක්ෂ කාර්යාල පුර්ණකාලීන වීම |

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 258

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නාමය : මහනුවර

රු.

| වැය විෂයය | සටහන | මූල්‍යකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ මඟහැරීම: ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1402 සැපැල් හා සන්නිවේදන | | 11 | 3,500,000.00 | | 1,000,000.00 | 4,500,000.00 | 3,906,739.21 | | 3,906,739.21 | 593,260.79 | 13.18% | විද්‍යුත් ඉලෙක්ට්‍රොනික ක්‍රම භාවිතයෙන් වියදම් පාලනය සිදු කිරීම |
| 1403 විදුලිය හා ජලය | | | 11,000,000.00 | | (1,500,000.00) | 9,500,000.00 | 6,942,673.76 | | 6,942,673.76 | 2,557,326.24 | 26.92% | සූර්ය පැනල පද්ධතිය ස්ථාපිත කිරීම මඟ වියදම අඩුවීම |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | | 11 | 2,000,000.00 | | (500,000.00) | 1,500,000.00 | 1,500,000.00 | | 1,500,000.00 | - | 0.00% | |
| 1405 පිරිසිදු කිරීම හා සනීපාරක්ෂක සේවා | | | 4,000,000.00 | | 1,200,000.00 | 5,200,000.00 | 4,439,903.50 | | 4,439,903.50 | 760,096.50 | 14.62% | වියදම් කළමනාකරණය |
| 1407 ආරක්ෂක සේවා | | | 3,200,000.00 | | 2,400,000.00 | 5,600,000.00 | 5,394,300.00 | | 5,394,300.00 | 205,700.00 | 3.67% | |
| 1409 වෙනත් | | | 11,500,000.00 | | (5,975,000.00) | 5,525,000.00 | 5,360,164.10 | | 5,360,164.10 | 164,835.90 | 2.98% | |
| **එකතුව ( ඇ )** | | | **38,200,000.00** | - | **(4,375,000.00)** | **33,825,000.00** | **29,279,264.44** | - | **29,279,264.44** | **4,545,735.56** | | |
| අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ) | | | **1,344,000,000.00** | **104,000,000.00** | **1,000,000.00** | **1,449,000,000.00** | **1,422,802,703.77** | **483,910.00** | **1,423,286,613.77** | **25,713,386.23** | | |
| | | | | | | | | | | | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම්, ප්‍රදානයන් සහ සහනාධාර | 7 | | | | | | | | | | | |
| මාරුකිරීම් | | | | | | | | | | | | |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | | 11 | 5,000,000.00 | | (1,000,000.00) | 4,000,000.00 | 3,776,095.09 | | 3,776,095.09 | 223,904.91 | 5.60% | නව දේපළ ණය ලබාදීම සංවෘතව පැවතීම |
| එකතුව | | | **5,000,000.00** | - | **(1,000,000.00)** | **4,000,000.00** | **3,776,095.09** | - | **3,776,095.09** | **223,904.91** | | |
| | | | | | | | | | | | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් | 9 | | | | | | | | | | | |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | | | | | | | | | | | | |
| 1701 [illegible] | | 11 | - | - | - | - | | | - | - | 0.00% | |
| එකතුව | | | - | - | - | - | | | - | - | 0.00% | |
| වැඩසටහන (1) | | | | | | | | | | | 0.00% | |
| මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9) | | | **1,349,000,000.00** | **104,000,000.00** | - | **1,453,000,000.00** | **1,426,578,798.86** | **483,910.00** | **1,427,062,708.86** | **25,937,291.14** | 1.79% | |
| | | | | | | | | | | | | |
| මූලධන වියදම | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය | | | | | | | | | | | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | | | | | | | | | | | |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | 11 | 149,000,000.00 | | | 149,000,000.00 | 144,123,501.63 | | 144,123,501.63 | 4,876,498.37 | 3.27% | |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | | 11,000,000.00 | | | 11,000,000.00 | 7,839,885.50 | | 7,839,885.50 | 3,160,114.50 | 28.73% | කාර්යාල නිලධාරීන් මගින් අත්‍යවශ්‍යතා හඳුනා සිදු කර ඇතිම |
| 2003 වාහන | | | 11,000,000.00 | | | 11,000,000.00 | 9,722,979.29 | | 9,722,979.29 | 1,277,020.71 | 11.61% | නව වාහන ලබාදීමට යෝජනා වී ඇති බැවින් අනවශ්‍ය අත්‍යවශ්‍යතා පමණක් සිදු කිරීම |

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 258

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : මහනුවර

රු.

| වැය විෂයය | සටහන | ප්‍රතිපාදනය | | | | | වියදම | | | ශුද්ධ පිරිසැලීම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍යකරණ සංකේත අංකය | වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුදල් පොතට අනුව වියදම (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | මුළු වියදම (7)= (5)+(6) | ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | වෙනස්කම්වලට හේතු |
| එකතුව (අ) | | | 171,000,000.00 | | | 171,000,000.00 | 161,686,366.42 | | 161,686,366.42 | 9,313,633.58 | | |
| | | | | | | | | | | | | |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | | | | | | | | | | | |
| 2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 11 | 15,000,000.00 | | | 15,000,000.00 | 14,960,900.95 | | 14,960,900.95 | 39,099.05 | 0.26% | |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | 11 | 15,000,000.00 | | | 15,000,000.00 | 14,813,643.33 | | 14,813,643.33 | 186,356.67 | 1.24% | |
| එකතුව (ආ) | | | 30,000,000.00 | | | 30,000,000.00 | 29,774,544.28 | | 29,774,544.28 | 225,455.72 | | |
| | | | | | | | | | | | | |
| හැකියා වර්ධනය | 14 | | | | | | | | | | | |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | | 11 | 3,000,000.00 | | | 3,000,000.00 | 973,097.08 | | 973,097.08 | 2,026,902.92 | 67.56% | දිවයින පුරා කුඩාපරිමාණ ශක්‍යතාවන් පැලදුම් කල පසුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම |
| එකතුව (ඉ) | | | 3,000,000.00 | | | 3,000,000.00 | 973,097.08 | | 973,097.08 | 2,026,902.92 | | |
| | | | | | | | | | | | | |
| වෙනත් මූලධන වියදම් | 15 | | | | | | | | | | | |
| 2509 වෙනත් | | 11 | | 98,000,000.00 | | 98,000,000.00 | 81,705,707.65 | | 81,705,707.65 | 16,294,292.35 | 16.63% | දිවයින පුරා කුඩාපරිමාණ ශක්‍යතාවන් පැලදුම් කල පසුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම |
| එකතුව (ඊ) | | | - | 98,000,000.00 | - | 98,000,000.00 | 81,705,707.65 | | 81,705,707.65 | 16,294,292.35 | | |
| | | | | | | | | | | | | |
| වැඩසටහන (I) | | | | | | | | | | | | |
| රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ) | | | 204,000,000.00 | 98,000,000.00 | - | 302,000,000.00 | 274,139,715.43 | - | 274,139,715.43 | 27,860,284.57 | 9.23% | |
| | | | | | | | | | | | | |
| මුළු වියදම්වල එකතුව (සටහන 5-15) | | | 1,553,000,000.00 | 202,000,000.00 | - | 1,755,000,000.00 | 1,700,718,514.29 | 483,910.00 | 1,701,202,424.29 | 53,797,575.71 | 3.07% | |
| | | | | | | | | | | | | |

* අදාළ වැය විෂයයන් පමණක් ඇතුළත් කර අනවශ්‍ය සංශෝධනය කර ගත යුතු ය.

..............................

ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2026.02.16

කේ.සිවචන්ද්‍රන්
ප්‍රධාන ගණකාධිකාරී
මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 258

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : මහනුවර

රු.

| වැය විෂය | සටහන | ප්‍රතිපාදනය | | | | | වියදම | | | ශුද්ධ පිලතුම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය කරණ සංකේත අංකය | වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම් (3) (-)/+ | ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුදල් පොතට අනුව වියදම (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | ශුද්ධ වියදම (7)= (5)+(6) | ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | වෙනස්කම්වලට හේතු |
| පුනරාවර්තන වියදම | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| 258 -1-2-0 | | | | | | | | | | | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | | | | | | | | | | | |
| පුද්ගල පඩිනඩි | | | | | | | | | | | | |
| 1001 වැටුප් හා වේතන | | 11 | 1,030,000,000.00 | 157,000,000.00 | 115,000,000.00 | 1,302,000,000.00 | 1,293,801,247.36 | | 1,293,801,247.36 | 8,198,752.64 | 0.63% | |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | | 11 | 20,000,000.00 | | 11,000,000.00 | 31,000,000.00 | 30,307,927.72 | | 30,307,927.72 | 692,072.28 | 2.23% | |
| 1003 වෙනත් දීමනා | | 11 | 780,000,000.00 | | (110,000,000.00) | 670,000,000.00 | 640,348,123.49 | 8,613,354.00 | 648,961,477.49 | 21,038,522.51 | 3.14% | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | | | | | | | | | | | |
| ගමන් වියදම් | | | | | | | | | | | | |
| 1101 දේශීය | | 11 | 20,000,000.00 | | 2,500,000.00 | 22,500,000.00 | 20,710,901.50 | | 20,710,901.50 | 1,789,098.50 | 7.95% | පරිපාලන වියදම් මගින් වියදම් දැරීම හා වියදම් කළ. |
| **එකතුව (අ)** | | | **1,850,000,000.00** | **157,000,000.00** | **18,500,000.00** | **2,025,500,000.00** | **1,985,168,200.07** | **8,613,354.00** | **1,993,781,554.07** | **31,718,445.93** | | |
| සැපයීම් | | | | | | | | | | | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 11 | 35,500,000.00 | | (12,050,000.00) | 23,450,000.00 | 23,019,810.15 | | 23,019,810.15 | 430,189.85 | 1.83% | |
| 1202 ඉන්ධන | | 11 | 27,500,000.00 | | (6,300,000.00) | 21,200,000.00 | 19,557,879.19 | | 19,557,879.19 | 1,642,120.81 | 7.75% | පරිපාලන වියදම් මගින් වියදම් දැරීම හා වියදම් කළ. |
| 1203 ආහාර සහ හා නිල ඇඳුම් | | 11 | 16,000,000.00 | | - | 16,000,000.00 | 15,950,000.00 | | 15,950,000.00 | 50,000.00 | 0.31% | |
| 1205 වෙනත් | | 11 | - | | - | - | - | | - | - | 0.00% | |
| **එකතුව (ආ)** | | | **79,000,000.00** | - | **(18,350,000.00)** | **60,650,000.00** | **58,527,689.34** | - | **58,527,689.34** | **2,122,310.66** | | |
| නඩත්තු වියදම් | | | | | | | | | | | | |
| 1301 වාහන | | 11 | 20,000,000.00 | | (7,000,000.00) | 13,000,000.00 | 12,147,467.26 | | 12,147,467.26 | 852,532.74 | 6.56% | නව වාහන ලබාදීමට යෝජනා වී ඇති බැවින් අනවශ්‍ය අළුත්වැඩියා පමණක් සිදු කිරීම |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | | 11 | 8,000,000.00 | | (3,200,000.00) | 4,800,000.00 | 4,387,660.88 | | 4,387,660.88 | 412,339.12 | 8.59% | කාර්යාල නිලධාරීන් මගින් අළුත්වැඩියා කටයුතු සිදු කර ගැනීම |
| 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | 11 | 11,000,000.00 | | 8,000,000.00 | 19,000,000.00 | 18,513,392.09 | | 18,513,392.09 | 486,607.91 | 2.56% | |
| **එකතුව ( ඇ )** | | | **39,000,000.00** | - | **(2,200,000.00)** | **36,800,000.00** | **35,048,520.23** | - | **35,048,520.23** | **1,751,479.77** | | |
| සේවා | | | | | | | | | | | | |
| 1401 ප්‍රවාහන | | 11 | - | | - | - | - | | - | - | | |
| 1402 තැපැල් හා සන්නිවේදන | | 11 | 12,500,000.00 | | 4,000,000.00 | 16,500,000.00 | 15,611,546.23 | | 15,611,546.23 | 888,453.77 | 5.38% | විදුලි ඉලෙක්ට්‍රොනික ක්‍රම භාවිතයෙන් වියදම් පාලනය සිදු කිරීම |

ඒසීඒ-2(ii)

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 258

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : මහනුවර

රු.

| වැය විෂය | සටහන | ප්‍රතිපාදනය | | | | | වියදම | | | ශුද්ධ බලපෑම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය කරණ සංකේත අංකය | වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුදල් පොතට අනුව වියදම (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත පටිගත් අනුව) (6) | මුළු වියදම (7)= (5)+(6) | ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | වෙනස්කම්වලට හේතු |
| 1403 විදුලිය හා ජලය | | | 18,000,000.00 | | (2,600,000.00) | 15,400,000.00 | 9,970,205.92 | | 9,970,205.92 | 5,429,794.08 | 35.26% | විදුලි ඒකකයන්හි අය කරන මිල අඩුවීම හා වියදම් කළමනාකරණය |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | | | 500,000.00 | | 150,000.00 | 650,000.00 | 555,818.09 | | 555,818.09 | 94,181.91 | 14.49% | බදු කුලී ගෙවිය යුතු දිනට පෙර ගෙවීම මත වට්ටම් ලැබීම |
| 1405 පිරිසිදු කිරීම හා පවිත්‍රතා සේවා | | 11 | 15,000,000.00 | | (6,600,000.00) | 8,400,000.00 | 7,679,539.33 | | 7,679,539.33 | 720,460.67 | 8.58% | ඇතැම් කාර්යාල සඳහා නිලධාරීන් 2 ක සේවයේ යෙදවීමට යෝජනා වුවද එම තීරණ ක්‍රියාත්මක නොවීම |
| 1407 ආරක්ෂක සේවා | | | 15,000,000.00 | | 3,800,000.00 | 18,800,000.00 | 18,305,800.00 | | 18,305,800.00 | 494,200.00 | 2.63% | |
| 1409 වෙනත් | | | 8,000,000.00 | | 4,700,000.00 | 12,700,000.00 | 11,493,670.63 | | 11,493,670.63 | 1,206,329.37 | 9.50% | චක්‍රලේඛ උපදෙස් පරිදි වියදම් කළමනාකරණය සිදු කිරීම |
| එකතුව ( ඇ ) | | | **69,000,000.00** | - | **3,450,000.00** | **72,450,000.00** | **63,616,580.20** | - | **63,616,580.20** | **8,833,419.80** | | |
| අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ) | | | **2,037,000,000.00** | **157,000,000.00** | **1,400,000.00** | **2,195,400,000.00** | **2,142,360,989.84** | **8,613,354.00** | **2,150,974,343.84** | **44,425,656.16** | | |
| | | | | | | | | | | | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරු කිරීම්, ප්‍රදානයන් සහ සහනාධාර | 7 | | | | | | | | | | | |
| මාරු කිරීම් | | | | | | | | | | | | |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | | 11 | 8,000,000.00 | | (1,400,000.00) | 6,600,000.00 | 5,719,434.95 | | 5,719,434.95 | 880,565.05 | 13.34% | නව දේපළ ණය ලබාදීම තාවකාලිකව නවතා තිබීම |
| එකතුව | | | **8,000,000.00** | - | **(1,400,000.00)** | **6,600,000.00** | **5,719,434.95** | - | **5,719,434.95** | **880,565.05** | | |
| | | | | | | | | | | | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් | 9 | | | | | | | | | | | |
| වෙනත් පුනරාවර්තන වියදම් | | | | | | | | | | | | |
| 1701 පාඩු සහ කපාහැරීම් | | 11 | - | - | - | - | | | - | - | 0.00% | |
| එකතුව | | | - | - | - | - | | | | - | 0.00% | |
| වැඩසටහන (I) | | | | | | | | | | - | 0.00% | |
| මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9) | | | **2,045,000,000.00** | **157,000,000.00** | - | **2,202,000,000.00** | **2,148,080,424.79** | **8,613,354.00** | **2,156,693,778.79** | **45,306,221.21** | **2.06%** | |
| | | | | | | | | | | | | |
| මූලධන වියදම් | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| වැඩසටහන (I) | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය | | | | | | | | | | | | |

ඒසීඒ-2(ii)

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 258

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : මහනුවර

රු.

| වැය විෂයය | සටහන | ප්‍රතිපාදනය | | | | | වියදම | | | ශුද්ධ බලපෑම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලාශ්‍ර කරණ සංකේත අංකය | වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | අතිරේක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුදල් පොතට අනුව වියදම (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත සටහන්, අනුව) (6) | මුළු වියදම (7)= (5)+(6) | ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | වෙනස්කම්වලට හේතු |
| හැකියා වර්ධනය | 14 | | | | | | | | | | | |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | | 11 | 3,000,000.00 | | | 3,000,000.00 | 2,455,714.55 | | 2,455,714.55 | 544,285.45 | 18.14% | දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇතිවූ තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම |
| එකතුව (ඉ) | | | 3,000,000.00 | | | 3,000,000.00 | 2,455,714.55 | - | 2,455,714.55 | 544,285.45 | | |
| | | | | | | | | | | | | |
| වෙනත් මූලධන වියදම් | 15 | | | | | | | | | | | |
| 2509 වෙනත් | | 11 | | | | - | | | | | | |
| එකතුව (ඊ) | | | - | - | - | - | | | | | | |
| | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| ව්‍යාපෘති/ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ) | | | 3,000,000.00 | | | 3,000,000.00 | 2,455,714.55 | | 2,455,714.55 | 544,285.45 | 18.14% | |
| | | | | | | | | | | | | |
| මුළු වියදම්වල එකතුව (සටහන 5-15) | | | 2,048,000,000.00 | 157,000,000.00 | | 2,205,000,000.00 | 2,150,536,139.34 | 8,613,354.00 | 2,159,149,493.34 | 45,850,506.66 | 2.08% | |
| | | | | | | | | | | | | |

* අදාළ වැය විෂයයන් පමණක් ඇතුළත් කර ආකෘතිය සංශෝධනය කර ගත යුතු ය.

(අත්සන)
ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2026.02.16

කේ.සිවචන්ද්‍රන්
ප්‍රධාන ගණකාධිකාරී
මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

ඒඕඒ-3

# 2025 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : මහනුවර
වියදම් ශීර්ෂ අංකය : 258

රු.

| අග්‍රිම ගිණුම් අංකය | 2025 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය 1 | | | අග්‍රිම ලැබීම් 2 | | | අග්‍රිම පියවීම 3 | | | 2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4 | | | 2025 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නොපියවූ උප අග්‍රිම | නොපියවූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර) | එකතුව | භාණ්ඩාගාරයෙන් | වෙනත් මූලාශ්‍රවලින් | එකතුව | වියදම් මඟින් | මුදල් මඟින් | එකතුව | නොපියවූ උප අග්‍රිම ශේෂය | නොපියවූ අග්‍රිම ශේෂය | එකතුව | *5 | 6 |
| | 1(i) | 1(ii) | 1(iii) | 2(i) | 2(ii) | 2(iii)=2(i)+2(ii) | 3(i) | 3(ii) | 3(iii)=3(i)+3(ii) | 4(i) | 4(ii) | 4(iii)=4(i)+4(ii) | 5=1(iii)+2(iii)-3(iii) | |
| 305/24 | 3,224,317.11 | | 3,224,317.11 | 34,440.00 | - | 34,440.00 | 3,258,757.11 | - | 3,258,757.11 | - | - | - | - | - |
| 305/25 | | | - | 9,358,958,000.00 | 746,196,331.51 | 10,105,154,331.51 | 10,104,039,151.51 | 1,115,180.00 | 10,105,154,331.51 | - | - | - | - | - |

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න
   *(1) පේ‍්‍රෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2025.12.31 දිනට මුදල් ශේෂය ..... නැත
   (2) වෙනත් හේතු - ................................................ නැත

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.
ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.................................
ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2026.02.16

කේ.සිවචන්ද්‍රන්
ප්‍රධාන ගණකාධිකාරී
මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

* මෙම ශේෂය මූලා කාර්යසාධන ප්‍රකාශනයෙහි පෙන්විය යුතු ය.

ඒබිඒ -4

# 2024 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 258

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

රු.

| තැන්පතු ගිණුමේ නම | තැන්පතු අංකය | 2025 ජනවාරි 01 දිනට ශේෂය | වර්ෂය තුළ බැර කිරීම් | වර්ෂය තුළ හර කිරීම් | 2025 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|
| ඇප තැන්පත් | 6000-0-0-1-44 | 219,750 | 370,511 | 294,575 | 295,686 | 295,686 |
| | | | | | | |
| වෙන්ඩර් තැන්පත් | 6000-0-0-2-59 | 1,373,983 | 7,672,735 | 4,187,928 | 4,858,790 | 4,858,790 |
| | | | | | | |
| තෙවන පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු | 6000-0-0-13-25 | 20,010,016 | 236,737,636 | 209,521,761 | 47,225,891 | 47,225,891 |
| | | | | | | |
| කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම් මුදල් | 6000-0-0-16-06 | 272,924,729 | 64,406,052 | 245,590,997 | 91,739,784 | 91,739,784 |
| | | | | | | |
| වන්දි ගෙවීම් | 6000-0-0-17-01 | 158,436,034 | 270,064,787 | 279,223,233 | 149,277,588 | 149,277,588 |
| | | | | | | |
| ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් | 6000-0-0-18-07 | 426,179 | 20,157,853 | 20,572,084 | 11,948 | 11,948 |
| | | | | | | |
| | | 453,390,691 | 599,409,574 | 759,390,578 | 293,409,688 | 293,409,688 |

ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2026.02.16

කේ.සිවචන්ද්‍රන්
ප්‍රධාන ගණකාධිකාරී
මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

* අදාළ තැන්පතු අංක පමණක් යොදාගෙන ආකෘතිය සංශෝධනය කර ගත යුතු ය.

## 2025 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 258

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : මහනුවර

රු.

| අත්තිකාරම් ගිණුමේ නම | | අත්තිකාරම් ගිණුම් අංකය | 2025 ජනවාරි 01 දිනට ශේෂය (1) | වියදමෙහි උපරිම සීමා රු. ........ වර්ෂය තුළ හර කිරීම් (2) | | ලැබීම්වල අවම සීමා රු. ........ වර්ෂය තුළ බැර කිරීම් (3) | | හර ශේෂයන්ගේ උපරිම සීමා රු. ........ ශේෂය 4=(1)+(2)-(3) | බැරකම් පිළිබඳ උපරිම සීමා රු. ........ | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදලින් | හරස් සටහන් මගින් | මුදලින් | හරස් සටහන් මගින් | | | |
| (1) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 258011 | 308,439,679 | 149,669,105 | 22,351,595 | 143,764,777 | 22,756,187 | 313,939,415 | - | 313,939,415 |
| (2) | අනෙකුත් අත්තිකාරම් | - | - | - | - | - | - | - | - | - |
| (3) | විවිධ අත්තිකාරම් | - | - | - | - | - | - | - | - | - |

.......................................
ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2026.02.16

කේ.සිවචන්ද්‍රන්
ප්‍රධාන ගණකාධිකාරී
මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

## මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය - 2025

ACA-6 ආකෘතිය වෙනුවට නව CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව මෙහි අමුණා තිබිය යුතු ය. (SA-82)

Generate

# Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2025

NEW CIGAS FINAL 2025 REPORTS

| | | | |
|---|---|---|---|
| **Land-9153:** | 4,011,810,970.00 | **Table:** | SA 82 |
| **Building- 9151:** | 2,755,844,987.41 | **Year:** | 2025 |
| **Machinary-9152:** | 570,912,930.91 | **Rpt Date** | 2/13/2026 2:11:35 PM |
| **WIP-9160:** | 0.00 | **Head** | 258 |
| **Intangible-9154**: | **0.00** | | |
| **Lease-9180:** | **0.00** | | |

| Ledger | category | Item | Code | Opn_Bal | Opn_Bal_Add | TransferIn | Purchase | Disposal | Balance |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9151 | 1.1-Dwellings | | 61111 | 400,818,441.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 400,818,441.00 |
| | | Quarters | ****6111107 | 400,818,441.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 400,818,441.00 |
| 9151 | 1.2-Non Residential Building | | 61112 | 2,316,260,546.41 | 49,066,000.00 | 0.00 | 0.00 | 10,300,000.00 | 2,355,026,546.4 |
| | | Office Building | ****6111201 | 2,213,974,396.41 | 49,066,000.00 | 0.00 | 0.00 | 10,300,000.00 | 2,252,740,396.4 |
| | | Schools | ****6111202 | 37,371,150.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 37,371,150.00 |
| | | Building for Public Entertainment | ****6111204 | 62,915,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 62,915,000.00 |
| | | Factories | ****6111210 | 2,000,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 2,000,000.00 |
| 9152 | 2.1-Transport Equipment | | 61121 | 219,334,625.00 | 153,150,000.00 | 0.00 | 0.00 | 143,000,000.00 | 229,484,625.00 |
| | | Passenger vehicle | ****6112101 | 216,327,625.00 | 153,150,000.00 | 0.00 | 0.00 | 143,000,000.00 | 226,477,625.00 |
| | | Agricultural vehicle | ****6112103 | 3,000,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 3,000,000.00 |
| | | Motor cycle | ****6112109 | 7,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 7,000.00 |
| 9152 | 2.2-Other Machinary & Equipment | | 61122 | 277,242,318.71 | 37,857,865.86 | 168,800.00 | 29,890,494.28 | 3,731,172.94 | 341,428,305.91 |
| | | Office Equipment | ****6112201 | 49,052,458.35 | 6,676,240.48 | 0.00 | 3,101,170.01 | 961,314.00 | 57,868,554.84 |
| | | Computer Equipment | ****6112202 | 110,111,711.09 | 24,402,504.76 | 168,800.00 | 10,687,698.72 | 1,758,957.48 | 143,611,757.09 |
| | | Electrical Equipment | ****6112203 | 18,962,510.73 | 3,725,804.57 | 0.00 | 3,107,961.47 | 115,803.24 | 25,680,473.53 |
| | | Communication Equipment | ****6112204 | 2,715,998.45 | 16,670.00 | 0.00 | 8,397.00 | 0.00 | 2,741,065.45 |
| | | Furniture | ****6112205 | 95,745,677.14 | 2,771,146.05 | 0.00 | 12,961,867.08 | 877,098.22 | 110,601,592.05 |
| | | Musical Instruments | ****6112206 | 0.00 | 265,500.00 | 0.00 | 0.00 | 0.00 | 265,500.00 |
| | | Paintings Sculptures & other Antiques | ****6112209 | 14,521.84 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 14,521.84 |
| | | Industrial & Manufacturing Equipment | ****6112212 | 139,030.61 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 139,030.61 |
| | | Construction Eqipment | ****6112213 | 6,500.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 6,500.00 |
| | | Defence Equipment | ****6112215 | 20,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 20,000.00 |
| | | Agricultural & Dairy Farm Equipment | ****6112216 | 422,510.50 | 0.00 | 0.00 | 23,400.00 | 18,000.00 | 427,910.50 |
| | | Fire Protection Equipment | ****6112217 | 51,400.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 51,400.00 |
| 9153 | 4.1-Land | | 61410 | 3,958,987,970.00 | 110,400,000.00 | 0.00 | 0.00 | 57,577,000.00 | 4,011,810,970.0 |
| | | Land | ****614100 | 3,958,987,970.00 | 110,400,000.00 | 0.00 | 0.00 | 57,577,000.00 | 4,011,810,970.0 |

REMARKS
This is a computer-generated document. No signature is required.
-

Report Generated by the new CIGAS Web Application--Developed by Department of State Accounts, Ministry of Finance Planing and Economic Development.

Print

New CIGAS. All Rights Reserved. Powered by Ministry of Finance Planing and Economic Development .

## අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් | 5,689,293,047.33 | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම් වෙනුවෙන් කරන ලද හර කිරීම් | 2,153,807.50 | |
| අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් | 22,492,213.30 | 5,713,939,068.13 |
| අඩු කළා : | | |
| අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම් | 344,567,656.85 | |
| වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් | 9,097,264.00 | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම් වෙනුවෙන් කරන ලද බැර කිරීම් | 27,647,635.68 | |
| අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් | 616,349.00 | 381,928,905.53 |
| **2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය** | | **5,332,010,162.60** |

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.

3.5 අදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | ඒකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායමේ ඇස්තමේන්තුවේ % ලෙස |
| 1002-07-00 | මුද්දර ගාස්තු | * | * | 79968.92 | - |
| 10.03-07-03 | පෞද්ගලික දැව ප්‍රවාහන ගාස්තු | * | * | 1759024.83 | |
| 10.03.07.05 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාල බලපත්‍ර ගාස්තු | 1,600,000.00 | 1,800,000.00 | 18,10,156.00 | 100.56% |
| | | | | | |
| 10.03.07.99 | අනිකුත් බලපත්‍ර ගාස්තු | 12,000,000.00 | 13,500,000.00 | 18,249,942.52 | 135.18% |
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | 4,150,000.00 | 6,200,000.00 | 9959079.60 | 160.63% |
| 20.02.02.99 | අනිකුත් පොලී | 14,000,000.00 | 10,000,000.00 | 14,856,244.64 | |
| 20.03.02.03 | 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගාස්තු | * | * | 30853490.00 | - |
| 20.03.02.13 | විභාග හා අනෙකුත් ගාස්තු | * | * | 44900.00 | - |
| 20.03-02-14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම් | * | * | 22,160,040.00 | - |
| 20.03-02-99 | විවිධ | 4,000,000.00 | 5,000,000.00 | 7,835,041.74 | 156.70% |
| 20.03.03.02 | දඩ මුදල් හා රාජසන්තක කිරීම්- අනෙකුත් | * | * | 42,262,811.51 | 120.75% |
| 20.03.99.00 | අනිකුත් ලැබීම් | 10,000,000.00 | 35,000,000.00 | 42,262,811.51 | |
| 20.04.01.00 | වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල | * | * | 194,363,330.09 | - |
| 20.06.02.02 | වෙනත් | 30,000.00 | 27,000.00 | 341,227.00 | 126.38 |

✸ මෙම ආදායම සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීමක් සිදු නොකෙරේ.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම රු. | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසන් ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 3,394,000,000.00 | 3,655,000,000.00 | 3,585,756,487.00 | 98% |
| ප්‍රාග්ධන | 207,00,00.00 | 305,000,000.00 | 276,595,424.98 | 90% |

## 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර දෙන ලද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු

### අමාත්‍යාංශ

| අනු අංකය | අමාත්‍යාංශය | වැය ශීර්ෂය |
|---|---|---|
| 1 | ජනාධිපති කාර්යාලය | 001 |
| 2 | මැතිවරණ කොමිෂන් සභාව | 020 |
| 3 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 101 |
| 4 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 102 |
| 5 | ආරක්ෂක අමාත්‍යාංශය | 103 |
| 6 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | 110 |
| 7 | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 111 |
| 8 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | 112 |
| 9 | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | 117 |
| 10 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය | 118 |
| 11 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය | 124 |
| 12 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 126 |
| 13 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 130 |
| 14 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | 135 |
| 15 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 149 |
| 16 | පරිසර අමාත්‍යාංශය | 160 |
| 17 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | 171 |
| 18 | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | 186 |
| 19 | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 189 |
| 20 | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 194 |
| 21 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 196 |

## දෙපාර්තමේන්තු

| අනු අංකය | දෙපාර්තමේන්තුව | වැය ශීර්ෂය |
|---|---|---|
| 1 | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | 201 |
| 2 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 202 |
| 3 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 203 |
| 4 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 206 |
| 5 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 210 |
| 6 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 216 |
| 7 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 217 |
| 8 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 219 |
| 9 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 220 |
| 10 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 227 |
| 11 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 237 |
| 12 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 246 |
| 13 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 252 |
| 14 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 253 |
| 15 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 254 |
| 16 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 284 |
| 17 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 286 |
| 18 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 289 |
| 19 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 292 |
| 20 | රේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 303 |
| 21 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 307 |
| 22 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 324 |
| 23 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 326 |
| 24 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 327 |
| 25 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 328 |

3

මහනුවර දිස්ත්‍රික්කය

2025 වර්ෂයේ කැබිනට් අමාත්‍යාංශවල මුලධන ප්‍රතිපාදන උපයෝජනය

| අනු අංකය | අමාත්‍යාංශය | වැය ශීර්ෂය | ලැබී ඇති මුළු ප්‍රතිපාදනය රු. | ප්‍රතිපාදන පවරාදීම් | ශුද්ධ ප්‍රතිපාදනය | 2025.12.31 දිනට මුළු වියදම | 2025.12.31 දිනට ඉතිරි ප්‍රතිපාදනය | වියදමේ % | ඉතිරියේ % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ජනාධිපති කාර්යාලය | 001 | 9,756,846.14 | 2,400,000.00 | 7,356,846.14 | 6,966,902.24 | 389,943.90 | 94.7 | 5.3 |
| 2 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 101 | 22,965,404.91 | - | 22,965,404.91 | 22,173,411.71 | 791,993.20 | 96.6 | 3.4 |
| 3 | ආරක්ෂක අමාත්‍යාංශය | 103 | 1,451,334,924.11 | - | 1,451,334,924.11 | 1,416,871,627.39 | 34,463,296.72 | 97.6 | 2.4 |
| 4 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | 110 | 1,543,000.00 | 350,000.00 | 1,193,000.00 | 1,147,736.78 | 45,263.22 | 96.2 | 3.8 |
| 5 | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 111 | 406,011.00 | 11,138.00 | 394,873.00 | 387,335.99 | 7,537.01 | 98.1 | 1.9 |
| 6 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | 112 | 293,720.00 | 17,400.00 | 276,320.00 | 274,470.00 | 1,850.00 | 99.3 | 0.7 |
| 7 | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | 117 | 182,900,000.00 | 15,074,822.27 | 167,825,177.73 | 167,825,177.73 | - | 100.0 | 0.0 |
| 8 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය | 118 | 69,008,484.22 | 38,000.00 | 68,970,484.22 | 67,207,095.05 | 1,763,389.17 | 97.4 | 2.6 |
| 9 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය | 124 | 40,390,112.42 | 11,584,171.28 | 28,805,941.14 | 28,648,398.87 | 157,542.27 | 99.5 | 0.5 |
| 10 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 130 | 813,760.00 | 322,900.00 | 490,860.00 | 475,055.00 | 15,805.00 | 96.8 | 3.2 |
| 11 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | 135 | 153,504,561.71 | 112,453,893.28 | 41,050,668.43 | 39,363,180.17 | 1,687,488.26 | 95.9 | 4.1 |
| 12 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 149 | 14,789,361.04 | 111,703.00 | 14,677,658.04 | 13,129,858.80 | 1,547,799.24 | 89.5 | 10.5 |
| 13 | පරිසර අමාත්‍යාංශය | 160 | 779,390.00 | - | 779,390.00 | 742,152.75 | 37,237.25 | 95.2 | 4.8 |
| 14 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | 171 | 5,636,720.00 | 85,066.00 | 5,551,654.00 | 5,458,273.70 | 93,380.30 | 98.3 | 1.7 |
| 15 | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | 186 | 21,000,000.00 | - | 21,000,000.00 | 20,845,154.93 | 154,845.07 | 99.3 | 0.7 |
| 16 | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 194 | 3,326,331.00 | 5,337.50 | 3,320,993.50 | 3,247,798.52 | 73,194.98 | 97.8 | 2.2 |
| 17 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 196 | 2,671,298.58 | 596,425.00 | 2,074,873.58 | 2,027,774.23 | 47,099.35 | 97.7 | 2.3 |
| එකතුව | | | 1,981,119,925.13 | 143,050,856.33 | 1,838,069,068.80 | 1,796,791,403.86 | 41,277,664.94 | | |

මහනුවර දිස්ත්‍රික්කය

2025 වර්ෂයේ කැබිනට් අමාත්‍යාංශවල පුනරාවර්තන ප්‍රතිපාදන උපයෝජනය

| අනු අංකය | අමාත්‍යාංශය | වැය ශීර්ෂය | ලැබී ඇති මුළු ප්‍රතිපාදනය රු. | ප්‍රතිපාදන පවරාදීම් | ශුද්ධ ප්‍රතිපාදනය | 2025.12.31 දිනට මුළු වියදම | 2025.12.31 දිනට ඉතිරි ප්‍රතිපාදනය | වියදමේ % | ඉතිරියේ % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ජනාධිපති කාර්යාලය | 001 | 4,406,987.50 | 176,125.00 | 4,230,862.50 | 4,230,862.50 | - | 100.0 | 0 |
| 2 | මැතිවරණ කොමිෂන් සභාව | 020 | 32,990,434.00 | - | 32,990,434.00 | 32,785,168.00 | 205,266.00 | 99.4 | 0.6 |
| 3 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 101 | 2,207,129.74 | 100,000.00 | 2,107,129.74 | 2,105,153.74 | 1,976.00 | 99.9 | 0.1 |
| 4 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 102 | 1,866,196,160.00 | 10,480,000.00 | 1,855,716,160.00 | 1,846,088,752.62 | 9,627,407.38 | 99.5 | 0.5 |
| 5 | ආරක්ෂක අමාත්‍යාංශය | 103 | 432,156,574.99 | - | 432,156,574.99 | 404,066,368.89 | 28,090,206.10 | 93.5 | 6.5 |
| 6 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | 110 | 45,670,135.50 | 6,761,000.00 | 38,909,135.50 | 36,917,213.64 | 1,991,921.86 | 94.9 | 5.1 |
| 7 | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 111 | 14,908,516.00 | 1,190,504.00 | 13,718,012.00 | 13,511,855.42 | 206,156.58 | 98.5 | 1.5 |
| 8 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | 112 | 1,648,000.00 | 37,000.00 | 1,611,000.00 | 1,547,227.08 | 63,772.92 | 96.0 | 4.0 |
| 9 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය | 118 | 77,914,636.32 | 638,000.00 | 77,276,636.32 | 75,959,510.76 | 1,317,125.56 | 98.3 | 1.7 |
| 10 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය | 124 | 25,279,471.00 | 41,000.00 | 25,238,471.00 | 24,902,958.75 | 335,512.25 | 98.7 | 1.3 |
| 11 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 126 | 995,200.00 | 19,300.00 | 975,900.00 | 926,922.97 | 48,977.03 | 95.0 | 5.0 |
| 12 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 130 | 8,488,460.12 | 176,509.00 | 8,311,951.12 | 8,274,096.22 | 37,854.90 | 99.5 | 0.5 |
| 13 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 149 | 25,145,938.38 | 755,500.00 | 24,390,438.38 | 23,538,716.68 | 851,721.70 | 96.5 | 3.5 |
| 14 | පරිසර අමාත්‍යාංශය | 160 | 13,633,765.00 | 240,000.00 | 13,393,765.00 | 13,344,360.36 | 49,404.64 | 99.6 | 0.4 |
| 15 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | 171 | 756,880,081.70 | 25,868,775.00 | 731,011,306.70 | 715,498,711.95 | 15,512,594.75 | 97.9 | 2.1 |
| 16 | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 189 | 527,415.00 | 112,500.00 | 414,915.00 | 395,151.00 | 19,764.00 | 95.2 | 4.8 |
| 17 | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 194 | 650,000.00 | 205,000.00 | 445,000.00 | 422,099.48 | 22,900.52 | 94.9 | 5.1 |
| 18 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 196 | 4,956,550.31 | 184,000.00 | 4,772,550.31 | 4,581,483.19 | 191,067.12 | 96.0 | 4.0 |
| එකතුව | | | 3,314,655,455.56 | 46,985,213.00 | 3,267,670,242.56 | 3,209,096,613.25 | 58,573,629.31 | | |

5

මහනුවර දිස්ත්‍රික්කය

2025 වර්ෂයේ වෙනත් දෙපාර්තමේන්තුවල මූලධන ප්‍රතිපාදන උපයෝජනය

| අනු අංකය | දෙපාර්තමේන්තුව | වැය ශීර්ෂය | ලැබී ඇති මුළු ප්‍රතිපාදනය රු. | ප්‍රතිපාදන පවරාදීම් | ශුද්ධ ප්‍රතිපාදනය | 2025.12.31 දිනට මුළු වියදම | 2025.12.31 දිනට ඉතිරි ප්‍රතිපාදනය | වියදමේ % | ඉතිරියේ % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | 201 | 2,430,000.00 | 208,456.00 | 2,221,544.00 | 2,206,975.67 | 14,568.33 | 99.3 | 0.7 |
| 2 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 202 | 1,225,000.00 | - | 1,225,000.00 | 1,220,440.00 | 4,560.00 | 99.6 | 0.4 |
| 3 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 203 | 1,400,000.00 | - | 1,400,000.00 | 1,388,000.00 | 12,000.00 | 99.1 | 0.9 |
| 4 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 206 | 2,440,645.00 | 35,000.00 | 2,405,645.00 | 2,405,645.00 | - | 100.0 | 0.0 |
| 5 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 210 | 27,250.00 | - | 27,250.00 | 27,250.00 | - | 100.0 | 0.0 |
| 6 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 216 | 4,351,574.00 | - | 4,351,574.00 | 4,241,863.53 | 109,710.47 | 97.5 | 2.5 |
| 7 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 217 | 6,022,660.00 | 240,000.00 | 5,782,660.00 | 5,610,267.80 | 172,392.20 | 97.0 | 3.0 |
| 8 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 219 | 24,669,018.44 | 14,523,018.44 | 10,146,000.00 | 10,105,001.85 | 40,998.15 | 99.6 | 0.4 |
| 9 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 220 | 2,232,628.00 | 693,493.00 | 1,539,135.00 | 1,539,134.25 | 0.75 | 100.0 | 0.0 |
| 10 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 237 | 138,000,000.00 | 5,927,000.00 | 132,073,000.00 | 132,072,080.68 | 919.32 | 100.0 | 0.0 |
| 11 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 246 | 2,150,000.00 | 174,762.65 | 1,975,237.35 | 1,975,237.35 | - | 100.0 | 0.0 |
| 12 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 252 | 79,436,453.39 | 3,622,000.00 | 75,814,453.39 | 74,895,822.07 | 918,631.32 | 98.8 | 1.2 |
| 13 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 253 | 689,200.00 | - | 689,200.00 | 688,881.00 | 319.00 | 100.0 | 0.0 |
| 14 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 254 | 4,955,636.25 | 1,051,509.28 | 3,904,126.97 | 3,863,519.83 | 40,607.14 | 99.0 | 1.0 |
| 15 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 289 | 2,342,596.00 | 1,500,000.00 | 842,596.00 | 832,617.36 | 9,978.64 | 98.8 | 1.2 |
| 16 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 292 | 2,875,014.05 | 1,657,604.75 | 1,217,409.30 | 1,217,409.30 | - | 100.0 | 0.0 |
| 17 | රේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 303 | 39,766.52 | 10,000.00 | 29,766.52 | 28,480.26 | 1,286.26 | 95.7 | 4.3 |
| 18 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 307 | 175,609.46 | - | 175,609.46 | 175,609.46 | - | 100.0 | 0.0 |
| 19 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 324 | 306,920.00 | 44,400.00 | 262,520.00 | 262,449.70 | 70.30 | 100.0 | 0.0 |
| 20 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 326 | 2,000,000.00 | - | 2,000,000.00 | 1,945,115.38 | 54,884.62 | 97.3 | 2.7 |
| 21 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 327 | 2,921,000.00 | - | 2,921,000.00 | 2,896,141.80 | 24,858.20 | 99.1 | 0.9 |
| 22 | මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව | 328 | 846,058.00 | - | 846,058.00 | 791,924.30 | 54,133.70 | 93.6 | 6.4 |
| එකතුව | | | 281,537,029.11 | 29,687,244.12 | 251,849,784.99 | 250,389,866.59 | 1,459,918.40 | | |

මහනුවර දිස්ත්‍රික්කය

2025 වර්ෂයේ වෙනත් දෙපාර්තමේන්තුවල පුනරාවර්තන ප්‍රතිපාදන උපයෝජනය

| අනු අංකය | දෙපාර්තමේන්තුව | වැය ශීර්ෂය | ලැබී ඇති මුළු ප්‍රතිපාදනය රු. | ප්‍රතිපාදන පවරාදීම් | ශුද්ධ ප්‍රතිපාදනය | 2025.12.31 දිනට මුළු වියදම | 2025.12.31 දිනට ඉතිරි ප්‍රතිපාදනය | වියදමේ % | ඉතිරියේ % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | 201 | 67,541,177.00 | 2,289,495.00 | 65,251,682.00 | 63,773,928.76 | 1,477,753.24 | 97.7 | 2.3 |
| 2 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 202 | 10,000.00 | - | 10,000.00 | 10,000.00 | - | 100.0 | 0.0 |
| 3 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 203 | 1,500.00 | - | 1,500.00 | 1,500.00 | - | 100.0 | 0.0 |
| 4 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 206 | 6,103,776.00 | 83,200.00 | 6,020,576.00 | 5,942,216.99 | 78,359.01 | 98.7 | 1.3 |
| 5 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 210 | 317,143.65 | 12,200.00 | 304,943.65 | 299,337.98 | 5,605.67 | 98.2 | 1.8 |
| 6 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 216 | 34,093,128.29 | 1,200,580.50 | 32,892,547.79 | 32,608,943.14 | 283,604.65 | 99.1 | 0.9 |
| 7 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 217 | 835,900.00 | 72,000.00 | 763,900.00 | 725,639.13 | 38,260.87 | 95.0 | 5.0 |
| 8 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 219 | 359,471.25 | 97,000.00 | 262,471.25 | 260,991.00 | 1,480.25 | 99.4 | 0.6 |
| 9 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 220 | 1,740,000.00 | 990,000.00 | 750,000.00 | 750,000.00 | - | 100.0 | 0.0 |
| 10 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 227 | 40,475,538.74 | - | 40,475,538.74 | 39,537,353.13 | 938,185.61 | 97.7 | 2.3 |
| 11 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 252 | 3,270,882.67 | 332,000.00 | 2,938,882.67 | 2,775,358.73 | 163,523.94 | 94.4 | 5.6 |
| 12 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 253 | 213,977,516.23 | - | 213,977,516.23 | 207,637,059.08 | 6,340,457.15 | 97.0 | 3.0 |
| 13 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 254 | 32,028,101.11 | 4,115,311.20 | 27,912,789.91 | 27,911,391.98 | 1,397.93 | 100.0 | 0.0 |
| 14 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 284 | 5,147,900.00 | - | 5,147,900.00 | 5,014,402.00 | 133,498.00 | 97.4 | 2.6 |
| 15 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 286 | 10,261,928.00 | - | 10,261,928.00 | 10,230,722.06 | 31,205.94 | 99.7 | 0.3 |
| 16 | රේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 303 | 35,532,500.00 | - | 35,532,500.00 | 34,652,500.00 | 880,000.00 | 97.5 | 2.5 |
| 17 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 307 | 2,031,501.72 | 898,000.00 | 1,133,501.72 | 1,068,480.44 | 65,021.28 | 94.3 | 5.7 |
| 18 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 326 | 1,197,000.00 | - | 1,197,000.00 | 1,063,719.44 | 133,280.56 | 88.9 | 11.1 |
| 19 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 327 | 932,377.20 | 245,000.00 | 687,377.20 | 660,272.00 | 27,105.20 | 96.1 | 3.9 |
| 20 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 328 | 1,432,860.44 | - | 1,432,860.44 | 1,315,664.88 | 117,195.56 | 91.8 | 8.2 |
| එකතුව | | | 457,290,202.30 | 10,334,786.70 | 446,955,415.60 | 436,239,480.74 | 10,715,934.86 | | |

**3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

| වත්කම කේතය | කේත විස්තරය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2025 දිනට මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 2,755,844,987.41 | 2,755,844,987.41 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 570,912,930.91 | 570,912,930.91 | | |
| 9153 | ඉඩම | 4,011,810,970.00 | 4,011,810,970.00 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම | - | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම | - | | | |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date |
| සිපිසිජී/කේඩී/ඒ/ම.දි.ලේ/ මූ.ප්‍ර.වි/2025/42 | | 2026 මැයි 19 දින |

ගණන්දීමේ නිලධාරී
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 මැයි 15 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ-6) සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි CIGAS වැඩසටහන අනුව 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල අනෙකුත් යන්ත්‍ර හා උපකරණවල (9152) රු. 11,172,608 ක වෙනසක් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ – 6) වාහනවල (මගී ප්‍රවාහන රථවල) 2025 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 226,477,625 ක් ලෙස සඳහන් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ඇති සියලුම වාහනවල තක්සේරු වටිනාකම රු. 265,050,000 ක්

වූයෙන් මූල්‍ය නොවන වත්කම්හි වාහනවල (මගී ප්‍රවාහන රථවල) වටිනාකම අතර රු. 38,572,375 ක වෙනසක් පැවතුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 50(ii) අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිවත්, සම්පූර්ණවත් පිළියෙල කරන බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වුවද, වැය විෂයයන් 15 ක් සඳහා වෙන් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් සියයට 14 සිට සියයට 100 දක්වා එනම් එකතුව රු. 246,673,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මුදල් රෙගුලාසි 66 මගින් අඩු කර තිබුණි. වැය විෂයයන් 08 ක් සඳහා පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් සහ මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන්ගෙන් සියයට 25 සිට සියයට 75 දක්වා එනම් එකතුව රු. 25,250,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 15 ක ශුද්ධ ප්‍රතිපාදනවලින් එකතුව රු. 36,430,214 ක් හෙවත් සියයට 11 සිට සියයට 67 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

### 3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය මගින් අදියර 02 ක් යටතේ 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබා දුන් මුදල්වලින් තවදුරටත් අක්‍රිය සමිති සතු රජයේ අරමුදල් හා ඊට අදාළ පොලිය ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය විසින් අනුමත කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට හැකිවන පරිදි දිස්ත්‍රික් ලේකම් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කිරීමට 2025 පෙබරවාරි 14 දිනැති අංක RDB/GS/Dist-01/2025 දරන ලිපියෙන් ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා දී තිබුණි. එම ලිපිය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක අක්‍රිය සමිති 21 කට අදාළව මහනුවර දිස්ත්‍රික් ලේකම් පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණු එකතුව රු. 9,922,930 ක මුදලක් තවදුරටත් නිෂ්කාර්යව පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. ඒ අනුව 2019 ඔක්තෝබර් 14 දිනැති අංක PS/SD/GS/PME/10/2019(01) දරන ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව ජීවනෝපාය සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය යන අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ විවිධ නිෂ්පාදන හා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ප්‍රතිලාභීන් 67 දෙනෙකු සඳහා ග්‍රාම ශක්ති ව්‍යාපාරය විසින් ලබා දුන් එකතුව රු. 5,195,000 ක ණය මුදලින් 2025 සැප්තැම්බර් 30 දිනට ප්‍රතිලාභීන් 43 දෙනෙකුගේ එකතුව රු. 675,072 ක ශේෂයක් අයවිය යුතුව පැවතුණි. ණය ගෙවා අවසන් වන දිනය පසුවී වසර 02 ත් වසර 04 ත් අතර කාලයක් ගතවී තිබුණි.

(ඇ) ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම ශක්ති සමිති මගින් ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති ණය ශේෂයන්ගෙන් එකතුව රු. 734,600 ක අක්‍රිය ණය ශේෂයක් පැවතුණි. මෙම මුදල් අඛණ්ඩව මාස 03 ක් ණය ගෙවීම පැහැර හැරි පුද්ගලයින් 07 ක්, මාස 03 ත් 06 ත් අතර ණය ගෙවා නොමැති 14 ක් හා අඛණ්ඩව මාස 06 ට වැඩි කාලයක් ගෙවීම් පැහැර හැරි ණයකරුවන් 30 දෙනෙකුගෙන් අය විය යුතුව පැවතුණි.

(ඈ) වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මත ගිවිසුම්ගත වටිනාකම රු. 2,000,000 ක් වූ ක්‍රේග්හෙඩ් වත්ත උඩ කොටස පානීය ජල ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරීක්ෂාවේදී වැඩ විෂය අංක 10 යටතේ පීඑන්ටී 11 වෙනුවට පීඑන්ටී 07 ජලනල යොදා තිබීමත් හා වැඩ විෂය අංක 11 යටතේ පීඑන්ටී 11 වෙනුවට පීඑන්ටී 04 ජල නළ යොදා තිබීමත් හේතුවෙන් ප්‍රමිතියෙන් තොර ඇස්තමේන්තුවෙන් බාහිරව බාල වර්ගයේ ජල නළ එලා තිබීම, විධිමත් පරිදි නියමිත ප්‍රමාණයන්ගෙන් ජල මූලාශ්‍රය ආරම්භයේ සිට ජල නළ එළා නොතිබීම, ජල ටැංකිය සඳහා ශක්තිමත් දැල් ආවරණයක් යොදා නොතිබීම, කාණු කැපීමෙන් තොරව පොළොව මතුපිටට නිරාවරණය වන පරිදි ජල නළ එළා තිබීම වැනි අඩුපාඩු පැවති අතර විගණිත දින වූ 2026 පෙබරවාරි 06 දින වන විටත් ටැංකියට ජලය පිරවීමේ සහ ජලය බෙදාහැරීමේ කටයුතු ආරම්භ කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ගිවිසුම්ගත වටිනාකම රු. 2,019,162 ක් වූ රාක්ෂාව දෙමළ විද්‍යාලයට නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරීක්ෂාවේදී, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය අනුව මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ 2025 අගෝස්තු 22 දිනැති අංක CP/EDU/PL/04/නඩත්තු/CSL දරන ලිපිය ප්‍රකාරව එහි අනුමත සැලැස්මට අනුව වැසිකිළි පද්ධතිය ඉදි කළ යුතු වුවත්, එයින් බැහැර සැලසුමකට අනුව ඉදිකිරීම් කර තිබුණු අතර, ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 25 යටතේ Orissa pan-Rocel or Equivalent වර්ගයේ වැසිකිළි පෝච්චි 04 ක් යෙදිය යුතු වුවද, යොදා තිබුණු වැසිකිළි පෝච්චි 04 හි වර්ගය සඳහන් කර නොතිබුණි.

(ඊ) ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය මගින් කිරිගව පාලන ව්‍යාපෘතිය සඳහා මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු. 856,000 ක ප්‍රතිපාදන 2025 අගෝස්තු 07 දිනැති අංක KDS/2/9/1/4 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීගේ ලිපියෙන් වෙන් කර දී තිබුණි. කන්දෙකුඹුර වසමේ ගවගාල් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් 13 දෙනෙකු තෝරාගෙන තිබුණද, ප්‍රතිලාභීන් සිව් දෙනෙකු ව්‍යාපෘතියෙන් ඉවත් වීම නිසා රු. 257,000 ක මුදලක් එනම් ඇස්තමේන්තුගත මුදලින් සියයට 31 ක් ආපසු පවරා දී තිබුණි.

## 3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| අනු අංකය | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහය<br>xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති | 2019 හා 2021 වර්ෂවල සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු. 129,657 ක ආපදා ණය ශේෂයන් වසර 04 ක හා 06 ක කාලයක් ගත වී තිබුණද නිරවුල් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මු.රෙ 206 | පොදු තැන්පතු වලින් ගෙවීම් කිරීමේදි නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කර ගෙවීම් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක අවස්ථා 80 කදී එකතුව රු. 8,790,695 ක ගෙවීම් බලයලත් එක් නිලධාරියෙකු පමණක් සහතික කර ගෙවීම් කර තිබුණි. |
| (II) | මු.රෙ 389 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක අවස්ථා 251 කදී එකතුව රු. 32,139,636 ක් වටිනා චෙක්පත් භාරගත් බවට ආදායකයාගේ අත්සන යොදා අනන්‍යතාවය තහවුරු කර නොතිබුණි. |
| (III) | මු.රෙ 1645 (අ) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 11 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වාහන 06 ක ලොග් සටහන් පොත්වල අලුත්වැඩියා කිරීම්, ටයර් මිලදී ගැනීම්, වාර්ෂික බලපත්‍ර ලබා ගැනීම, වාර සේවාවන් ගමන් පිළිබඳ මාසික සාරාංශ සටහන්, හානි, ඉන්ධන දහන පරීක්ෂාවන් වැනි තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ හා විධිවිධාන<br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ලිපි | |
| (i) | 2013 ජුලි 08 දිනැති අංක HAF/03/ADMIN/02/002 දරන ලිපිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක වසම් 84 කට අදාළව අවස්ථා 177 කදී අනවසර අල්ලා ගැනීම් පිළිබඳ දෙසති වාර්තා ග්‍රාම නිලධාරීන් විසින් නියමිත දිනට ඉදිරිපත් කර |

| | | |
|---|---|---|
| | | නොතිබුණි. |
| (ii) | 2013 ජුනි 12 දිනැති අංක HAF/01/09/විවිධ දරන ලිපිය | සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් ඉදිරි වැඩසටහන් අදාළ මාසයේ ආරම්භක දිනට සතියකට පෙරද, කළ වැඩසටහන් ඉදිරි වැඩසටහන්වලට අදාළ සංශෝධනද සමඟ ඊළඟ මාසයේ පළමු සතිය තුළ ඉදිරිපත් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක නිලධාරීන් 157 දෙනෙකු අවස්ථා 364 කදී දින 05 සිට මාස 08 ක කාලයක ප්‍රමාදයක් සහිතව ඉදිරි වැඩසටහන්ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක නිලධාරීන් 123 දෙනෙකු අවස්ථා 333 කදී දින 05 සිට මාස 09 දක්වා කාලයක ප්‍රමාදයක් සහිතව කළ වැඩසටහන්ද ඉදිරිපත් කර තිබුණි. |
| (iii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ යුතු දිනය පසු වී වසර 1 ½ ත් වසර 02 ත් අතර කාලයක් ගත වී තිබුණද, චක්‍රලේඛ විධිවිධාන අනුව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. |
| (ඈ) | මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ<br>2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන කළමනාකරණ චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් සතු එකතුව රු. 568,244,188 ක ඉඩම්, ගොඩනැගිලි හා වත්කම් 153 ක් අවසන් වරට තක්සේරු කර තිබුණේ 2001 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වන අතර 2025 දෙසැම්බර් 31 දින වන විට මෙම මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර වර්ෂ 06 සිට වර්ෂ 24 ක කාලයක් ගත වී පැවතුණි. |
| (ඉ) | ආයතනයේ කළමනාකරණ හා අභ්‍යන්තර නියෝගවලට අනුකූල නොවීම<br>2019 මැයි 03 දිනැති අංක KDS/1/8/1/37 දරන මහනුවර දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය | වර්ෂයේ මුල් මාස 06 තුළ ග්‍රාම නිලධාරී කාර්යාල පරීක්ෂා කර අවසන් කළ යුතු අතර එහිදී නිරීක්ෂණය වූ අඩුපාඩු හා දුර්වලතා නිවැරදි කර ගැනීමට දෙවන අර්ධ වර්ෂය තුළ කටයුතු කිරීමට නිර්දේශ කර තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 කට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල 168 ක් මුල් මාස 06 තුළ පරීක්ෂා කර නොතිබුණි. |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කාර්යසාධනය**

**4.1.1 සැලැසුම් කිරීම**

(අ) 1996 ජූලි 26 දිනැති, 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත, 1999 ඔක්තෝබර් 08 දිනැති, 1999 අංක 33 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල (සංශෝධන) පනත, 1996 නොවැම්බර් 06 දිනැති අංක 948/10 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සමාජ ආරක්ෂණ පනතේ 06 වන ඡේදය යටතේ කරනු ලබන නියෝගයෙහි ඇතුළත් උප ලේඛනයෙහි XV අනුව හා 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 04 නියෝගය ප්‍රකාරව, වයස අවු: 18 ට වැඩි හා 59 ට අඩු ධීවර හා කෘෂි අංශවල සේවයේ නියුතු අය හැර වෙනත් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්, ගොවි හෝ විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රම පනතින් ආවරණය නොවන වෙනත් අංශයක රැකියාවක නියුතු පුද්ගලයින් හා විශ්‍රාම වැටුපකට හිමිකම් ලබා නොසිටින්නන් හෝ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් නොදරන්නන් මෙම යෝජනා ක්‍රමයට දායක කර ගත යුතු වේ. මහනුවර දිස්ත්‍රික්කයේ 2024 වර්ෂයේ අවුරුදු 18 ට වැඩි හා 59 ට අඩු වයස් පුද්ගලයින් සංඛ්‍යාව ආසන්න වශයෙන් 793,287 ක් පමණ විය. එයින් රජයේ විශ්‍රාම වැටුප් දායක ලබන්නන් සංඛ්‍යාව 64,117 ක්ද, ගොවි විශ්‍රාම වැටුප් ලබන්නන් සංඛ්‍යාව 67,466 ක්ද වේ. ඒ අනුව මෙම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ආසන්න වශයෙන් පුද්ගලයින් 661,704 ක් දායක කර ගත හැකි වුවද, 1997 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දක්වා අවුරුදු 28 ක කාලපරිච්ඡේදය තුළ පුද්ගලයින් 81,533 ක් පමණ එනම් සියයට 12 ක අඩු ප්‍රතිශතයක් දායක කර ගෙන තිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 හි වාර්ෂික ඉලක්කය පුද්ගලයින් 70 සිට 520 දක්වා පරාසයක වූ අතර දිස්ත්‍රික්කයේ වාර්ෂික ඉලක්කය දායක කර ගත හැකි පුද්ගල සංඛ්‍යාවෙන් සියයට 0.75 ක් පමණක් වූයෙන්ද වසර 28 ක් තුළ වාර්ෂිකව ප්‍රතිලාභ ක්‍රමයට දායක කර ගැනීමේ සාමාන්‍ය පුද්ගලයන් 2912 ක් පමණක් වූයෙන්ද මෙම පනතින් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයා වෙත ලබා දීම සඳහා රජයේ නිලධාරීන්ගේ දායකත්වය අවම මට්ටමක පැවතුණි.

(ආ) මහනුවර දිස්ත්‍රික්කයේ මානව සම්පත් හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය මගින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී,

(i) මහනුවර දිස්ත්‍රික්කයේ 2025 වර්ෂයේ 09 වසර සිසු සංඛ්‍යාව 21356 ක් වූ අතර කාර්යසාධනය මැනීමේ විශේෂිත දර්ශකයක් වූ 9 වසර පාසල් සිසුන් සඳහා කාණ්ඩ විෂයයන් තෝරා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ ඉලක්කගත ශිෂ්‍ය සංඛ්‍යාව එයින් සියයට 17.5 ක් හෙවත් 3740 ක් විය. සැබෑ දැනුවත් කිරීමේ ශිෂ්‍ය සංඛ්‍යාව 2544 ක් හෙවත් ඉලක්කගත සංඛ්‍යාවෙන් සියයට 68 ක් වැනි අඩු කාර්යසාධන මට්ටමක පැවතුණි.

(ii) පාසල් හැර යන්නන් රැකියාගත කිරීමට අපේක්ෂිත ප්‍රමාණය 1330 ක් වුවද, රැකියා ගත කළ ප්‍රමාණය ඉලක්කයෙන් සියයට 57 ක් හෙවත් 762 ක් වීමෙන් අඩු කාර්යසාධන මට්ටමක් පැවතුණි.

(ඇ) දරුවෙකුගේ මුල් ළමා විය සංවර්ධනයේදී උපතේ සිට අවුරුදු 05 දක්වා කාලය තුළ ශාරීරික, මනෝ සමාජීය හා සංජානනීය සංවර්ධනයෙන් යුතු දරු පරපුරක් බිහි කිරීමේ දැක්ම මූලික කර ගනිමින් වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසුවිපරම් කිරීම තුළින් දරුවන්ගේ මුල් ළමා වියේ සමස්ත සංවර්ධනය සහතික කිරීමේ මෙහෙවර ඉටු කළ යුතුය. ඒ අනුව මුල් ළමා විය සංවර්ධනයට අදාළ ගැබිණි මව්වරුන් සඳහා රු. 4,500 ක එක් වරක් පමණක් ගෙවන රු. 5,000 ක පෝෂණ දීමනාව ලබා දීම, පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර ලබා දීම යන වැඩසටහන් තුළින් දරුවෙකුගේ ශාරීරික වර්ධනය මූලික කර ගනිමින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2025 වර්ෂය තුළ රු. 654,050,867 ක් හා ගුරු අභිමානී පෙර පාසල්

ගුරු දීමනාව සඳහා රු. 59,147,632 ක් වැය කර තිබුණද, දරුවෙකුගේ බුද්ධි වර්ධනය, භාෂා සංවර්ධනය, සමාජ හා හැඟීම් සංවර්ධනය යන මුල් ළමා විය සංවර්ධනයේ ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි හා ඉහත සඳහන් කළ ශාරීරික, මනෝ සමාජීය හා සංජානනීය සංවර්ධනය යන අරමුණු ත්‍රිත්වයම ඉටු වන පරිදි ප්‍රමාණවත් වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මහනුවර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි කාර්යාලය වැටලීම් 1800 ක්, ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, 2025 දෙසැම්බර් මස 16 වන දින වන විට වැටලීම් 1335 ක් පමණක් සිදු කර තිබුණි. එය ලබා දී ඇති ඉලක්ක වලින් සියයට 74 ක ප්‍රමාණයක් විය. මුළු වැටලීම් ප්‍රමාණයෙන් 431 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නඩු පවරා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මහනුවර දිස්ත්‍රික්කයේ විදාතා අංශයේ අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් 11 ක් යටතේ ක්‍රියාකාරකම් 28 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණද 2025 ඔක්තෝබර් 31 දින වන විට ක්‍රියාකාරකම් 12 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණි.

(ඊ) මිනුම් ඒකක හා ප්‍රමිති සේවා අංශයෙහි වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මෙහි වැරදි කිරුම් මිනුම් උපකරණ පරීක්ෂා කිරීම හා අත්අඩංගුවට ගැනීම්/ අධිකරණ කටයුතුවලට යොමු කිරීම් 840 ක් වර්ෂය තුළ සිදු කළ යුතු බවට ඉලක්ක ලබා දී තිබුණද, 2025 ජනවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද වැරදි කිරුම් මිනුම් උපකරණ පරීක්ෂා කිරීම් හා අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය 50 ක් හෙවත් සියයට 06 ක් පමණ විය. 2025 වර්ෂයේ 1,2,3 කාර්තු සඳහා නඩු පැවරීම් පිළිවෙලින් 210,240,190 ලෙස භෞතික ඉලක්ක ලබා දී තිබුණද, මෙම අංශය විසින් 2025 වර්ෂයේ පළමු කාර්තුව තුළදී නඩු පැවරීම් 25 ක්ද, දෙවන කාර්තුව තුළදී නඩු පැවරීම් 22 ක්ද, තෙවන කාර්තුව තුළදී නඩු පැවරීම් 02 ක්ද වශයෙන් පළමු කාර්තු 03 තුළ නඩු පැවරීම් තත්‍ය අගය සියයට 08 ක් පමණක් විය.

(උ) දිස්ත්‍රික්කය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් මහජනයාට කිරුම් මිනුම් කටයුතු පිළිබඳ දැනුමක් ලබා දීම සඳහා වර්ෂය තුළදී දැනුවත් කිරීමේ වැඩසටහන් 300 ක් සිදු කළ යුතු බවට වාර්ෂික ඉලක්ක ලබා දී තිබුණද, 2025 ජනවාරි සිට 2025 ඔක්තෝබර් දක්වා වැඩසටහන් 111 ක් පමණක් පවත්වා තිබීම හේතුවෙන් 2025 ඔක්තෝබර් මාසය දක්වා ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය සියයට 37 ක ප්‍රමාණයකි.

(ඌ) ජාතික පොහොර ලේකම් කාර්යාලයේ 2025 ක්‍රියාත්මක සැලැස්මට අනුව පොහොර නව නිෂ්පාදකයින්ට බලපත්‍ර ලබා දීම, ආනයන බලපත්‍ර ලබාදීම 10 ක් සිදු කළ යුතු වුවත්, 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කිසිදු බලපත්‍රයක් ලබා දී නොතිබුණි.

(එ) පොහොර සම්බන්ධ ගුණාත්මක භාවය තහවුරු කිරීම සඳහා ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන, ප්‍රාදේශීය ගබඩා, පෞද්ගලික රසායනික හා කාබනික පොහොර අලෙවිසැල් හා නිෂ්පාදනාගාර වලින් පොහොර නියැදි 150 ක් ලබා ගැනීම සඳහා 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක ලබා දී තිබුණද, 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පොහොර සාම්පල් 31 ක් පමණක් ලබා ගෙන තිබුණි.

### 4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Out come) ලබා නොගැනීම

සෞභාග්‍යා නිෂ්පාදන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විසින් ප්‍රතිලාභීන් 192 දෙනෙකු සඳහා 2021, 2023 හා 2025 වර්ෂවල දියර කිරි/එළු කිරි නිෂ්පාදනය, විසිතුරු මල්, බිම්මල්, වැල් දොඩම්, ගම්මිරිස් පැළ, කිතුල් හා වැනිලා වගාකිරීම, කිරිගව හා සත්ත්ව පාලනය වැනි ව්‍යාපෘති සඳහා එකතුව රු. 145,013,573 ක රජයේ දායකත්වයක් ලබා දී තිබුණද, එම ව්‍යාපෘති සතුන් මිය යෑම, ප්‍රතිලාභියා වෙනත් රැකියාවන් වෙත යොමු වීම, පදිංචිය අතහැර යාම, ප්‍රතිලාභියා මිය යාම, පැළ මැරී යාම වැනි හේතූන් මත අක්‍රියව පැවතුණි.

### 4.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක වැඩසටහන් 07 කට අදාළ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. 85,668,991 ක් වූ ව්‍යාපෘති 20 ක් ආර්ථික අර්බුදය, මිල ගණන් කැඳවීමට කටයුතු නොකිරීම, ප්‍රාදේශීය සභාව විසින් මාර්ගය සම්පූර්ණයෙන්ම ඉදිකිරීම, අමුද්‍රව්‍ය මිල ඉහළ යාම වැනි හේතූන් මත නිම නොකර අත්හැර දමා තිබුණි. මෙම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 03 කට අදාළ 2025 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,196,372 ක පිරිවැයක් දරා තිබුණි.

### 4.2 ප්‍රසම්පාදනයන්

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා සූර්ය පැනල පද්ධතියක් සවි කිරීමට රු. 13,331,474 ක වැට් සහිත මුදලකට 2024 දෙසැම්බර් 19 දින ගිවිසුම් ගත වී 2025 සැප්තැම්බර් 01 දින රැඳවුම් මුදල් හැර රු. 11,998,327 ක වැට් සහිත මුදලක් සැපයුම්කරු වෙත ගෙවීම් කර තිබුණි. මේ පිළිබඳ පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) මාර්ගෝපදේශය හා 2020 අගෝස්තු 08 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ නියමයන් අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොකිරීම, 3.4.1 (අ) මාර්ගෝපදේශයෙන් බැහැරව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීම, අනුගමනය කරන ලද ප්‍රසම්පාදන ක්‍රමයේදී ලංසු කැඳවීම සඳහා සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන් 439 ක් සිටියදී පදනම් රහිතව තෝරා ගත් සැපයුම්කරුවන් 18 දෙනෙකුගෙන් මිල කැඳවීම් කිරීම, 6.1.4 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන ලේඛන නිකුත් කිරීම සම්බන්ධ වාර්තා තබා නොගැනීම, 5.4.8 (ආ) හා (ඇ) මාර්ගෝපදේශ අනුව කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබීම වැනි අඩුපාඩු පැවතුණි.

(ආ) කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුමේ 11 කොන්දේසිය අනුව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල් ඉටු කළ වැඩ අනුව වාරික වශයෙන් ගෙවීම් කිරීමෙන් තොරව රැඳවුම් මුදල හැර ඉතිරි සම්පූර්ණ මුදලම එනම් රු. 11,998,327 ක මුදල එකවර වැඩ නිම කිරීමට පෙර චෙක්පතක් ලියා මාස 09 ක කාලයක් දින දීර්ඝ කරමින් අත රඳවා ගෙන පසුව ගෙවීම් කර තිබුණි. ගිවිසුමේ 07 කොන්දේසිය අනුව 2024 දෙසැම්බර් 30 දිනට වැඩ නිම කර නොතිබුණද, 5.4.13

මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත්කරුගෙන් සිදු වන ප්‍රමාද පාලනය කර ප්‍රමාද ගාස්තු අය කිරීමට විධිවිධාන කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්තුව නියමිත දිනට නිම නොකිරීම මත මාස 03 ක කාලයක් වෙනුවෙන් විදුලි වියදමින් අඩු කර ගත හැකිව තිබුණු දළ වශයෙන් රු. 1,020,000 ක මුදලක් රජයට අහිමි වී තිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

- ඌන උපයෝජිත හා නිෂ්කාර්ය වත්කම්

(අ) ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2018 වර්ෂයට පෙර ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් ලැබී තිබුණු වටිනාකම තහවුරු නොවූ ජල ටැංකි 10 ක් විගණිත දින වූ 2026 පෙබරවාරි 20 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පවතින අක්කර 03 රූඩ් 02 පර්චස් 02 ක් වූ ඉඩම් කට්ටි 07 ක් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගෙන නොතිබුණි.

(ඇ) මහනුවර දිස්ත්‍රික්කයේ විද්‍යා සම්පත් මධ්‍යස්ථාන 05 ක් සතුව පවතින ස්ථාවර වත්කම්/උපකරණ 23 ක් දීර්ඝ කාලයක සිට ඌන උපයෝජිතව හා නිෂ්කාර්යව පැවතුණි.

## 4.4 පාඩු හා හානි පිළිබඳ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ඇමුණුම 1) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩුවල වසර 05 ට අඩු රු. 25,000 ට වැඩි පාඩු හා අත්හැරීම් සහ පාතහේවාහැට හා දෙල්තොට යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා දෙන ලද පාඩු හා අත්හැරීම් ප්‍රකාශනය අතර රු. 264,300 ක වෙනසක් පැවතුණි.

## 4.5 කළමනාකරණ දුර්වලතා

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක විශ්‍රාමිකයන් 159 දෙනෙකු වෙත එකතුව රු. 47,047,320 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. ඉන් එකතුව රු. 23,057,787 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අය කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක ජීවන වියදම් දීමනාව හා විශේෂ දීමනාව ලෙස විදෙස්ගත විශ්‍රාමිකයන් 96 ක් සඳහා එකතුව රු. 2,266,925 ක් අඩුවෙන් ගෙවා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ට අයත් ඉඩම් කැබලි 957 ක් වසර 01 සිට වසර 56 ක් දක්වා කාලයක් ගත වී තිබුණද, අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක පාසල් ඉඩම් 139 ක්ද, ක්‍රීඩා පිටි 12 ක්ද, සුසාන භූමි 136 ක්ද, වෙනත් දෙපාර්තමේන්තු ඉඩම් 193 ක්ද වශයෙන් එකතුව 480 ක්වූ ඉඩම් කැබලි වසර 01 ත් වසර 18 ත් අතර කාලයක් ගත වී තිබුණද, පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සිට 2025 නොවැම්බර් මස දක්වා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ මත නායයෑම් හා අධි අවදානම් තත්ත්වයන් හේතුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක පවුල් 1,665 ක් හඳුනාගෙන තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක පවුල් 218 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට නැවත පදිංචි කර තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක පවුල් 329 ක් විකල්ප අවස්ථා අනුව පදිංචිය සඳහා යොමු වී තිබුණු අතර තව දුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක පවුල් 1,083 ක් අධි අවදානම් ප්‍රදේශයේම පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක 2025 දෙසැම්බර් 31 දිනට වෙනත් පුද්ගලයන් හා ආයතන වෙත ගෙවීම් කිරීම සඳහා ලියන ලද එකතුව රු. 19,143,920 ක චෙක්පත් 144 ක් ගෙවීම් කිරීමෙන් තොරව අත රඳවා ගෙන 2025 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ගෙන තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනවල එම චෙක්පත් නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් වශයෙන් සාවද්‍ය ලෙස දක්වා තිබුණි.

(උ) 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(ආ) ඡේදය අනුව නිවාඩු දින රාජකාරී කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක නිලධාරීන් 43 දෙනෙකු දින 415 ක් සඳහා නිවාඩු දින සේවය කිරීමෙන් පසු ආවරණ අනුමැතිය ලබා ගෙන තිබුණි.

(ඌ) අධි අවදානම් ප්‍රදේශවල පදිංචි වූවන් නැවත පදිංචි කිරීම සඳහා ගඟඉහළ කෝරළේ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් කට්ටි 43 ක් බෙදා දී නිවාස ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේදී පළමු වාරිකය ලෙස එම ප්‍රතිලාභීන් 43 දෙනාට ගෙවා තිබුණු එකතුව රු. 8,600,000 ක මුදලින් ප්‍රතිලාභීන් 14 කගේ එකතුව රු. 2,395,000 ක මුදලක් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

(එ) 2025 නොවැම්බර් 27 දින රට තුළ ඇති වූ "දිට්වා" සුළි කුණාටුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ පවුල් 56942 කටද, පුද්ගලයින් 190582 කටද, බලපෑම් ඇති විය. සිදු වූ ජීවිත හානි සංඛ්‍යාව 241 ක් වන අතර, අතුරුදහන් වූ සංඛ්‍යාව 69 ක් වේ. නිවාස 1923 ක් පූර්ණ හානියට පත් වූ අතර අර්ධ නිවාස හානි 16638 ක් වාර්තා වී තිබුණි.

සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ජනතාව නඟා සිටුවීම සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2025 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. 1,742,015,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2025 දෙසැම්බර් 31 දිනට පවුල් 38451 ක් සඳහා රු. 25,000 බැගින් රු. 961,275,000 ක්ද, පවුල් 7096 ක් සඳහා රු. 354,469,625 ක් ගෙවීම් කර තිබුණි. පොත්පත් මිලදී ගැනීම සඳහා ළමුන් 8900 ක් සඳහා රු. 133,500,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණද, 5828 ක් සඳහා රු. 87,420,000 ක් ගෙවීම් කර තිබුණි. මරණ වන්දි ගෙවීම් කඩිනම් ප්‍රතිචාර වෙනුවෙන් රු. 271,290,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණද, රු. 108,660,000 පමණක් ගෙවීම් කර තිබුණි.

(ඒ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක ඉඩම් කැබලි 44 ක වන්දි මුදල් ගෙවීමේදී අත්පත් කර ගැනීමට අනුමැතිය ලද දින හා ප්‍රතිපාදන මුදල් ගෙවූ දින අතර වර්ෂ 04 සිට වර්ෂ 29 දක්වා කාලයක් ප්‍රමාදවීම හේතුවෙන් අත්පත් කර ගැනීමට අදාළ රු. 149,395,737 ක් වූ වන්දි මුදලට අමතරව රු. 68,295,103 ක පොලී මුදලක් ගෙවීම් කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට තවදුරටත් එකතුව රු. 29,318,340 ක වන්දි මුදලක්

සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළව එකතුව රු. 6,221,652 ක පොලී මුදලක් ගෙවිය යුතුව තිබුණි.

(ඔ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක වැඩිහිටි දීමනා ද්විගණනය වී ප්‍රතිලාභීන් 229 දෙනෙකුට ගෙවන ලද එකතුව රු. 3,197,000 ක මුදලින් තවදුරටත් එකතුව රු. 2,628,500 ක මුදලක් 2025 දෙසැම්බර් 31 දින වන විට අය කර නොතිබුණි.

(ඕ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මහනුවර දිස්ත්‍රික් උප කාර්යාලය වෙත 1977 කෙටි පණිවිඩ සේවා මගින් ලැබුණු පැමිණිලි 244 න් පැමිණිලි 134 ක් සඳහා වැටලීම් කිරීමට සැළසුම් කර තිබුණද, වැටලීම් 61 ක් සිදු කර ඇති අතර වැටලීම් 73 ක් අසාර්ථක වී තිබුණි. අවවාද කිරීම් 04 ක් හා කඩ වසා තැබීම් 01 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට පැමිණිලි 105 කට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ක) වසර 10 කට වැඩි කාලයක සිට අනවසරයෙන් පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයේ ඉඩම් වල පදිංචි වී ඇති සහ වගා කටයුතු කරන 08 දෙනෙකු සම්බන්ධයෙන් 2015 වර්ෂයේදී මූලික තේරීම් පරීක්ෂණයක් සිදු කර 2019 ජනවාරි 29 දින විරෝධතා විමසා දැන්වීම් ප්‍රසිද්ධ කර තිබුණි. ඉන්පසු 2023 ජූලි 26 දින නැවත ඉඩම් කච්චේරියක් පවත්වා ක්ෂේත්‍ර පරීක්ෂණයක් සඳහා යොමු කර තිබුණි. අනවසර කරුවන් හඳුනාගෙන වසර 10 කට වැඩි කාලයක් ගත වී තිබුණද, 2025 නොවැම්බර් 12 දින වන විටත් හඳුනාගත් අනවසර ඉඩම් නියමානුකූල කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ග) ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය සඳහා ඉඩම් ලබා දීමේ වැඩසටහන යටතේ ඉඩම් ලබා දීමේදී ඉඩම් නියෝග 197.2(ඇ) අනුව තමාගේ හෝ කලත්‍රයා නමින් නිවසක් හෝ නිවසක් තැනීමට යෝග්‍ය ඉඩමක් තම සේවා ස්ථානයේ සිට සැතපුම් 10 ක් ඇතුළත නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතු වේ. එසේ වුවද, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම්වරිය විසින් ඇය සතු නිවසක ස්ථිරව පදිංචිව සිටියදී ඉඩමක් ලබා ගෙන තිබුණි. තවද 2024 වර්ෂයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් පර්චස් 14.59 ක ඉඩම් කැබැල්ලක් ඇයගේ කලත්‍රයා විසින් ද ලබා ගෙන තිබුණි.

(ච) සාසා ව්‍යාපෘතිය යටතේ රජයේ ඉඩම් පරිපාලන සේවා සංගමයේ නිලධාරීන්ට දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමේදී ඉදිරිපත් කළ බදු කොන්දේසි අනුව ඉඩම පදිංචි නිවසක් තැනීම සඳහා පමණක් යොදා ගත යුතු අතර වසරක් තුළ ප්‍රාදේශීය ලේකම් සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු වේ. බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණු සාක්ෂාත් කරගැනීමට නියමිත කාලසීමාව තුළ අපොහොසත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබිය යුතු වුවද, ඉඩම් කට්ටි 26 ක් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව බදුකරු කටයුතු කර නොමැති වුවද, විගණිත දින වූ 2025 ජූලි 31 දින දක්වාම ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5. තිරසර සංවර්ධනය

### තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව, 2017 ඔක්තෝබර් 03 දිනැති, 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් මානව අභිවෘද්ධිය උදෙසා සමාජීය, ආරක්ෂණ හා පාරිසරික යන අංග ආවරණය වන ලෙස

තිරසර සංවර්ධන අරමුණු 17 ක් හා ඊට අදාළ මැනුම් දර්ශක හඳුනා ගෙන, තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, උපාය මාර්ග සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතු අතර, 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි, ඉහත ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව කාර්යසාධන ප්‍රතිඵල මත පදනම්ව මිනුම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද මිනුම් දර්ශක හඳුනාගෙන ඒවා මත පදනම්ව සැළසුම් සකස් කිරීම, ළඟා කර ගැනීම හා ප්‍රගතිය මැනීම සිදු කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අරමුණු 02 ක් පමණක් හඳුනාගෙන තිබුණි.

## 6. යහපාලනය

**මහජනයා වෙත සේවා ඉටු කිරීම**

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක වැඩිහිටි දීමනා ප්‍රතිලාභීන් 12104 ක් සඳහා රු. 48,983,800 ක මුදලක්ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක ආබාධිත දීමනා ප්‍රතිලාභීන් 822 ක් සඳහා රු. 5,657,500 ක මුදලක්ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක වකුගඩු දීමනා ප්‍රතිලාභීන් 309 ක් සඳහා රු. 2,780,000 ක මුදලක්ද 2025 දෙසැම්බර් 31 දින වන විට අධිභාර වී තිබුණි.

(ආ) 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත හා 2016 අංක 08 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 5.2 වගන්තිය අනුව වයස අවුරුදු 15 ට වැඩි සෑම පුද්ගලයෙකු සඳහාම ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක වයස අවු: 15 ත් 40 ත් අතර පුද්ගලයින් 56 ක්, වයස අවුරුදු 41 ත් 60 ත් අතර පුද්ගලයින් 136 ක්, වයස අවුරුදු 61 ට වැඩි පුද්ගලයින් 366 ක්, ආබාධිත පුද්ගලයින් 05 ක් හා උපත සනාථ කළ නොහැකි පුද්ගලයින් 11 දෙනෙක් වශයෙන් එකතුව 574 ක් වෙත 2025 දෙසැම්බර් 31 දින වන විටත් හැඳුනුම්පතක් නිකුත් කර නොතිබුණි.

(ඇ) පුරවැසි ප්‍රඥප්තියට අනුව දැව හෙළීමේ බලපත්‍රයක් සති 02 ක් ඇතුළත නිකුත් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක අවස්ථා 274 කදී දැව හෙළීමේ බලපත්‍රයක් නිකුත් කිරීමට සති 01 සිට සති 26 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

## 7. මානව සම්පත් කළමනාකරණය

**අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

(අ) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි 2025 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව හා සැසඳීමේදී පුරප්පාඩු 92 ක් හා අතිරික්ත 243 ක් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| | තනතුරු වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ | 108 | 89 | 19 | |
| ii. | තෘතියික | 103 | 59 | 44 | |
| iii. | ද්විතියික | 3449 | 3441 | 08 | 231 |
| iv. | ප්‍රාථමික | 217 | 196 | 21 | |
| | | 3,877 | 3,785 | 92 | 231 |

* 231 ක අතිරික්ත සංඛ්‍යාව සංවර්ධන නිලධාරීන්ගේ බව නිරීක්ෂණය විය.

(ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය අනුව සෑම නිලධාරියෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලැබෙන පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කළ යුතු බවට දක්වා තිබුණද, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි සේවයේ නියුතු නිලධාරීන් 3758 දෙනෙකු වෙනුවෙන් පැය 12 බැගින් පැය 45096 ක් සඳහා සංවර්ධන සැලැස්ම සකස් කළ යුතු වේ. 2025 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර තිබුණේ නිලධාරීන් 1600 ක් සඳහා පැය 9600 ක කාලසීමාවක් සඳහා බැවින් පැය 35496 ක ප්‍රමාණයක් සඳහා සැලසුම් සකස් කර නොතිබුණි.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්.ජී.මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

## 04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

### 4.1.1. ක්‍රමසම්පාදන අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| දිස්ත්‍රික් ක්‍රියාත්මක සැලැස්ම | 100% | | |
| විමධ්‍යගත ආයෝජන වැඩසටහන | 100% | | |
| ග්‍රාමීය මාර් ග සංව ර් ධන වැඩසටහන | 95% | දිට්වා ආපදා තත්ත්වය නිසා ඉලක්කයට ලඟා වීමට නොහැකි වීම | |
| වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 92% | දිට්වා ආපදා තත්ත්වය නිසා ඉලක්කයට ලඟා වීමට නොහැකි වීම | |
| වතු ආශ්‍රිත ආපදා නිවාස සංවර්ධන වැඩසටහන | දිට්වා ආපදා තත්ත්වය නිසා කාලය ප්‍රමාණවත් නොවීම | | |
| ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2025 | | 67% | දිට්වා ආපදා තත්ත්වය නිසා ඉලක්කයට ලඟා වීමට නොහැකි වීම |
| ප්‍රජා ශක්ති | 100% | | |
| VDP | 100% | | |
| දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 2025 | | 86% | දිට්වා ආපදා තත්ත්වය නිසා |
| ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීම - පාසල් ක්‍රීඩාපිටි සංවර්ධන වැඩසටහන් | | 75% | දිට්වා ආපදා තත්ත්වය නිසා |
| වොලිබෝල් ක්‍රීඩාංගණ නවීකරණය | දිට්වා ආපදා තත්ත්වය නිසා ඉලක්කයට ලඟා වීමට නොහැකි වීම | | 20% |
| වතු මාර්ග සංවර්ධන වැඩසටහන | දිට්වා ආපදා තත්ත්වය නිසා ඉලක්කයට ලඟා වීමට නොහැකි වීම | | 18% |

### 4.1.2.දිස්ත්‍රික් ඉංජිනේරු අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිල නිවාස හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු | 100% | | |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 යි කොන්ක්‍රීට් මාර්ගවල තත්ව පරීක්ෂණ | 100% | | |
| දිස්ත්‍රික්කයෙහි තාක්ෂණික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | දිට්වා ආපදා තත්ත්වයට අනුව සිදු වූ කාර්ය බහුලත්වය නිසා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම | | 60% |

### 4.1.3. ගිණුම් අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 2025 වර්ෂයට මූල්‍ය බලතල පැවරීම් | 100% | | |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන පිළියෙළ කිරීම් | 100% | | |
| 2025 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම් | 100% | | |
| වැටුප් ගනනය කිරීම සහ payroll පරිඝණක වැඩසටහන මගින් වැටුප් පිළියෙළ කිරීම් හා ගෙවීම් | 100% | | |
| මාසික ඒකාබද්ධ ගිනුම් සාරාංශ පිළියෙළ කිරීම් | 100% | | |
| පිලියෙළ කරන ලද මාසික බැංකු සැසඳුම් ප්‍රමාණය | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අත් මුදල් නිදහස් කිරීම් | 100% | | |
| ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීම් | 100% | | |
| පිළිතුරු සපයන ලද බාහිර හා අභ්‍යන්තර විගණන විමසුම් ප්‍රමාණය | 100% | | |
| වෙනත් දෙපාර්තමේන්තු /අමාත්‍යාංශ වල ගෙවීම් කටයුතු | 100% | | |
| වත්කම් සත්‍යාපනය කිරීම | 100% | | |
| ප්‍රසම්පාදන තීර ණ ප්‍රමාණය | 100% | | |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැඩි දියුණු කිරීම | 100% | | |
| ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම හා ගිණුම් ගත කිරීම | 100% | | |
| ආදායම් රැස් කිරීමේ කටයුතු | 100% | | |
| ප්‍රතිපාදන කළමනාකරණය | 100% | | |
| පොදු තැන්පත් ගිණුමේ කටයුතු | 100% | | |
| වව්චර් පත් පරීක්ෂා කිරීමේ කටයුතු | 100% | | |
| සරප්ගේ රාජකාරි කටයුතු | 100% | | |
| අග්‍රිම පාලන කටයුතු | 100% | | |
| භාණ්ඩ මිලදී ගැනීමට අදාළ ගබඩා පාලනය | 100% | | |
| විශ්‍රාම වැටුප් පිලිබඳ කටයුතු | 100% | | |

### 4.1.4.අභ්‍යන්තර විගණන අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| පවත්වන ලද දිස්ත්‍රික් විගණන හා කළමණාකරණ කමිටු සංඛ්‍යාව | දිට්වා සුළි කුනාටුව හේතුවෙන් එම කාලසීමාවට අදාල කමිටු පැවැත්වීමට නොහැකි විය | 75% | |
| ප්‍රාදේශිය විගණන හා කළමණාකරණ කමිටු | එම | | 68% |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද අභන්තර විගණන පරික්ෂණ සංඛ්‍යාව | 100% | | |
| | | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල අභන්තර විගණන පරික්ෂණ කටයුතු සංඛ්‍යාව | 100% | | |
| විමර්ශන කටයුතු සිදු කිරිම | 100% | | |
| ප්‍රධාන අභන්තර විගණකගේ කාර්තුමය ඇගයිම් වාර්තාව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කිරීම් | 100% | | |

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| පාර්ලිමේන්තු ප්‍රශ්නාවලිය සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම් | 100% | | |
| සකස්කර ඉදිරිපත් කරන ලද වාර්ෂික විගණන සැලැස්ම | 100% | | |
| සකස් කරන ලද වාර්ෂික අවදානම් ලේඛනය | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල සහ සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල ගෙවා නිමි වවුචර්පත් පරික්ෂා කිරීම් | දිට්ටා සුළි කුනාටුව හේතුවෙන් එම කාලසීමාවට අදාල වවුචර් පරික්ෂාව සිදු කිරීමට නොහැකි විය | | 56% |
| අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කිරීම් | 100% | | |
| අභ්‍යන්තර විගණන අංශයේ පොදු නිරීක්ෂණ | | 75% | |
| අභ්‍යන්තර නියෝග නිකුත් කිරීම් | දිට්වා සුළි කුනාටුව හේතුවෙන් දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටු කමිටු පැවැත්වීමට නොහැකි විම හේතුවෙන් | | |

### 4.1.5. සංවර්ධන අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| කළමනාකරණ සේවා නිලධාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම වෙනුවට පවත්වන පුහුණු වැඩසටහන | 100% | | |
| කළමනාකරණ නොවන සේවා (PL) කාණ්ඩය | දිට්වා සුළි කුනාටුව හේතුවෙන් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කොහැකි විය | 85% | |
| ආධුනික පුහුණුලාභීන් සඳහා පුහුණුව ලබා දීම | 100% | | |
| තාක්ෂණික නොවන නිලධාරි පුහුණු වැඩසටහන් | 100% | | |
| රාජ්‍ය සේවයේ නව බඳවා ගැනීම් වලට අදාල සේවාරම්භක පුහුණු | 100% | | |
| අවස්ථානුකූලව නම් කරනු ලබන නිළධාරි කාණ්ඩ සඳහා විෂයානුබද්ධ පුහුණුව | 10% | | |
| පුහුණුලාභින් සඳහා විෂයානුබද්ධ හෝ රැකියාගත පුහුණු සඳහා යොමු කිරීම | 100% | | |
| විමර්ෂණ , මහජන පැමිණිලි සහ පරීක්ෂණ | 100% | | |
| මත්ද්‍රව්‍ය නිවාරණය කිරීමේ දැනුවත් කිරීම් | 100% | | |
| වන අලි වන්දි ගෙවීම් | 100% | | |
| තොරතුරු ඉල්ලුම්පත් ප්‍රමාණය ,භාර ගැනීම්, තොරතුරු නිලධාරි වෙත යොමු කිරීම්, තොරතුරු ලබා දීම් | 100% | | |
| තොරතුරු දැන ගැනීමේ පනත සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීම් | 100% | | |
| වාර්ෂික අබිං කමිටුව පැවැත්වීම හා බලපත්‍ර නිකුත් කිරීම | 100% | | |
| සංවර්ධන වැඩසටහන්, ජාතික උත්සව සම්බන්ධිකරණය | දළදා පෙරහැර සහ දන්ත ධාතු වන්දනා කිරීම පමණක් සිදු විය | | 10% |
| සංචාරක බංගලාවෙන් කිරීමේ කටයුතු | 72% | | |
| පාර්ලිමේන්තු ගිණුම්කාරක සභාවට නිර්ණායක ඉදිරිපත් කිරීම | 100% | | |
| කාර්ය සාධන වාර්තාව සකස් කිරීම | 100% | | |
| අස්වැසුම තොරතුරු ලබා ගැනීම, විරෝධතා හා අභියාචනා සම්බන්ධිකරණය | 100% | | |
| අස්වැසුම අදියර 2 නව සමාජිකයින් ලියාපදිංචි කිරීම | 100% | | |

### 4.1.6. ඉඩම් අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| දෛනික තැපැල | 100% | | |
| මහජනතාව විසින් යොමුකර ඇති ඉඩම් සම්බන්ධ ගැටළු | 99% | | |
| ආමාත්‍යාංශ මහින් යොමුවෙන ඉඩම් සම්බන්ධ ගැටළු | 90% | | |
| ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය හා ආණ්ඩුකාර කාර්යාලය මහින් ලැබෙන ඉඩම් සම්බන්ධ ගැටලු | | 81% | |
| පරිසර කටයුතු පිළිබඳ කමිටු රැස්වීම් | | | 56% |
| දැව හෙලීම් | 111% | | |
| ජල, විදුලි හා යටිතල පහසුකම් ගැටළු | | 88% | |
| නිල නිවාස වෙන් කිරීම් | හිස්වන ප්‍රමාණය අනුව වෙන් කරනු ලබයි. | | |
| නිල නිවාස සම්බන්ධ අලුත්වැඩියා කටයුතු | ලැබෙන ඉල්ලීම් අනුව | | |
| වාර්ෂික ගිනි අවි බලපත්‍ර අලුත් කිරීම හා ආදේශ බලපත්‍ර නිකුත් කිරීම් | | 81% | |
| ගිනි අවි බලපත්‍ර වලට අදාල වෙනත් රාජකාරි | 114% | | |

### 4.1.7. ආයතන අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| දෛනික තැපැල සම්බන්ධ කටයුතු | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිළධාරීන්ගේ නිල හැඳුනුම්පත් නිකුත් කිරීම | 100% | | |
| A,B,C රැස්වීම් ශාලා සඳහා දිනපොත පවත්වාගෙන යාම | 100% | | |
| සුළු අක්මුදල් පවත්වාගෙන යාම | 100% | | |
| උඩරට කලා සංගමයේ රැස්වීම් සටහන් සකස් කිරීම | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන සම්බන්ධ සියළු කටයුතු | 100% | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල වාහන සම්බන්ධ දිස්ත්‍රික් ලේකම් තුමාට බලය පැවරු ආයතන කටයුතු | 100% | | |
| වාහන සම්බන්ධ වෙනත් කටයුතු | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය මාණ්ඩලික නිලධාරින්ගේ ආයතන කටයුතු | 100% | | |
| ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ ආයතන කටයුතු | 100% | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල මාණ්ඩලික නිලධාරින්ගේ ආයතන කටයුතු | 100% | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඒකාබද්ධ සේවයේ මාණ්ඩලික නොවන නිලධාරින්/රියදුරන්ගේ ආයතන කටයුතු | 100% | | |
| වෙනත් දෙපාර්තමේන්තු නිලධාරින්ගේ ආයතන කටයුතු | 100% | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ආරක්ෂක/පිරිසිදු කිරිමේ සේවයට අදාල රාජකාරි කටයුතු | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරි නොවන, ඒකාබද්ධ සේවයට අයත් සියළුම සේවාවන්ට අයත් නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු හා ආයතන කටයුතු | 100% | | |
| ග්‍රාම නිලධාරි විනය කටයුතු | 100% | | |
| | | | |

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ කළ/ඉදිරි වැඩසටහන් නිවාඩු, නිවාඩු දින වැටුප්, අතිරේක ඉන්ධන අනුමැතිය | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආරක්ෂක සේවය/පිරිසිදු කිරිමේ සේවයට අදාල ගෙවීම් වවුචරය සකස් කිරිම | 100% | | |
| දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පුරප්පාඩු වාර්තා කිරීම/ පුරප්පාඩු ලිපි නිකුත් කිරීම | 100% | | |
| දි.ලේ.කාර්යාලයේ හා ප්‍රා.ලේ. කාර්යාල වල අනුමත කාර්ය මණ්ඩල තොරතුරු කැදවීම | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් රාජකාරි දින පොත යාවත්කාලීන කිරිම | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කළ/ඉදිරි වැඩසටහන්, නිවාඩු, ගමන් වියදම්, අතිරේක ඉන්ධන හා විදේශ ගමන් සම්බන්ධ රාජකාරි | 100% | | |
| දිසාපති සමුළුව සම්බන්ධ රාජකාරි | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් විසින් පවරන වෙනත් රාජකාරි | 100% | | |
| ග්‍රාම නිලධාරි ස්ථාන මාරු සම්බන්ධ රාජකාරි | 100% | | |
| ග්‍රාම නිලධාරින් දෙමළ භාෂාවෙන් නිදහස් කිරිමේ රාජකාරි | 100% | | |
| ග්‍රාම නිලධාරි උසස් කිරිම සම්බන්ධ රාජකාරි | 100% | | |
| ග්‍රාම නිලධාරින් ස්ථිර කිරිම සම්බන්ධ රාජකාරි | 100% | | |
| දුම්රිය බලපත්‍ර නිකුත් කිරිමට අදාල රාජකාරි | 100% | | |
| ගණකාධිකාරි/සංවර්ධන නිලධාරි පෞද්ගලික ලිපිගොනු | 100% | | |
| අනුමත කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරිම | 100% | | |
| මැතිවරණ කටයුතු | 100% | | |
| නිල ඇඳුම් දීමනා රාජකාරි | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලේඛණාගාරයේ කටයුතු | 100% | | |
| සියළුම නිලධාරින්ගේ අතිකාල අනුමත කිරිමට අදාල රාජකාරි | 100% | | |
| ආකෘතිපත්‍ර නිකුත් කිරිමට අදාල රාජකාරි | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයට අදාල රාජකාරි | 100% | | |
| දෛනික විද්‍යුත් තැපැල පරික්ෂාව හා අදාල අංශ වෙත යොමු කිරිම | 100% | | |
| විද්‍යුත් ලිපි යැවිමේ කටයුතු | 100% | | |
| කාර්යාලීය වෙබ් අඩවිය යාවත්කාලීන කිරිම | 100% | | |
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරිම | 100% | | |
| සියළුම නිලධාරින්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරි | 100% | | |
| ඇඟිලි සලකුණු යන්ත්‍රය සම්බන්ධ කටයුතු | 100% | | |
| මාණ්ඩලික නිලධාරින්ගේ නිවාඩු දින වැටුප් රාජකාරි | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ඉදිරි / කළ වැඩසටහන් අනුමැතියට ඉදිරිපත් කිරීම(SYSCGAA පරිඝණක පද්ධතිය හරහා) | 100% | | |
| ක්ෂේත්‍ර නිලධාරින්ගේ ගමන් වියදම් වවුචර් සම්බන්ධ කටයුතු | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත සියළුම වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු නිලධාරින්ගේ පෞද්ගලික උපගොනු නඩත්තු කිරිම | 100% | | |
| ඇප තැම්පත් කිරිම සම්බන්ධ කටයුතු | 100% | | |
| අත්තිකාරම් බී ගිණුම යටතේ ණය ගෙවීම සම්බන්ධ කටයුතු | 100% | | |
| රෙජිස්ට්‍රාර් අංශයේ පොදු කටයුතු | 100% | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල සමුළුව පැවැත්වීමට අදාල සම්බන්ධිකරණ කටයුතු | 100% | | |

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| **විශේෂිත දර්ශක** | **අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්** | | |
| | **100% - 90%** | **100% - 90%** | **50% - 74%** |
| ඵලදායිතා හා විදේශ නියෝජිත සම්බන්ධීකරණ කටයුතු | 100% | | |
| දිසාපතිතුමා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි | 100% | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල නිලධාරින් සම්බන්ධව ලැබෙන පැමිණිලි, ජනාධිපති කාර්යාලයෙන් හා අගමැති කාර්යාලයෙන් ලැබෙන පැමිණිලි හා වෙනත් මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු | 100% | | |
| නීති සම්බන්ධ කටයුතු | 100% | | |
| වෙනත් විවිධ මහජන පැමිණිලි හා ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරිම | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරින්ගේ අග්‍රහාර රක්ෂණ ක්‍රමයට අදාල රාජකාරි | 100% | | |
| ආයතන අංශයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරිම හා ප්‍රගතිය වාර්තා කිරිම | 100% | | |
| අමාත්‍යාංශ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල සමඟ සම්පත් හුවමාරුව සඳහා සන්නිවේදන ජාලය කාර්‍යක්ෂමව පවත්වාගෙන යාම | 100% | | |
| තොරතුරු හා මෙවලම් වැඩිදියුණු කිරිම | 100% | | |
| නිල විද්‍යුත් සන්නිවේදන පද්ධතිය පවත්වාගෙන යාම | 100% | | |
| දෛනික තැපැල පරිගණක පද්ධතියට ඇතුලත් කිරිම | 100% | | |
| ලිපි තැපැල් කිරිමේ කටයුතු | 100% | | |
| ආයතන අංශයේ යන්ත්‍ර සූත්‍ර වලට අදාල ගොනු කටයුතු | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ජල, විදුලි,දුරකථන හා පුවත්පත් බිලිපත් පියවීමට අදාල රාජකාරි | 100% | | |
| භාෂා දීමනාව ගෙවිමට අදාල රාජකාරි | 100% | | |
| නිල නිවාස කුලි අය කර ගැනිමට අදාල රාජකාරි | 100% | | |
| වරිපනම් බදු ගෙවිමට අදාල රාජකාරි | 100% | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සියළුම සංවර්ධන නිලධාරින්ගේ සේවය ස්ථිර කිරිම, අනුයුක්ත කිරිම්, ස්ථාන මාරු කිරිම්, උසස් කිරිමේ කටයුතු හා විනය කටයුතු සම්බන්ධ රාජකාරි | 100% | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිළධාරින්ගේ නිවාඩු දින වැටුප් හා ස.ප්‍රා.ලේ / ගණකාධිකාරි/පරිපාලන නිලධාරී / පරිපාලන ග්‍රාම නිලධාරී නිවාඩු දින වැටුප් අනුමත කිරීම. | 100% | | |

**4.1.8.** ජන හා සංඛ්‍යා ලේඛණ අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2024 සමීක්ෂණය පැවැත්වීම | 100% | | |
| ශ්‍රීලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය-කේතකිරීම,සංස්කරණයහා පරිගණක ගත කිරීම (එක් එක් ප්‍රා. ලේ.කොට්ඨාශ භාර නිලධාරියා විසින් ඉටු කරනු ලබයි) | 100% | | |
| ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය - 2025 සමීක්ෂණ පැවැත්වීම | 100% | | |
| කාණ්ඩ 1 (විවෘත වෙළදපොල සිල්ලර මිල රැස්කිරීම - සතිපතා) | 100% | | |
| කාණ්ඩ 1 (විවෘත වෙළදපොල සිල්ලර මිල රැස්කිරීම - මසකට වරක්) | 100% | | |
| කාණ්ඩ 11 (විවෘත වෙළදපොල සිල්ලර මිල රැස්කිරීම - මසකට වරක්) | 100% | | |
| නිෂ්පාදකයාගේමිල - | 100% | | |
| කාණ්ඩ 111 (විවෘත වෙළදපොල සිල්ලර මිල රැස්කිරීම - කාර්තුවකට වරක්) | 100% | | |
| වී අස්වනු සමීක්ෂණය | 100% | | |
| වී වගාකළ බිම් ප්‍රමාණය පිළිබද සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම හා දිස්ත්‍රික් වාර්තාව සැකසීම | 100% | | |
| ගොඩ භෝග පිළිබද සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම හා දිස්ත්‍රික් වාර්තාව සැකසීම | 100% | | |
| මස් පිණිස මරනු ලබන සතුන් පිළිබද සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම | 100% | | |
| ගොඩනැගිලි සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම | 100% | | |
| පලාත් පාලන සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම | 100% | | |
| වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය | 100% | | |
| දැව සංඛ්‍යාලේඛන රැස් කිරිම | 100% | | |
| සංඛ්‍යාන නිබන්ධනය සකස් කිරීම 2025 | 100% | | |
| වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය | 100% | | |
| ත්‍රෛයිමාසික කර්මාන්ත සමීක්ෂණය | 100% | | |
| ගව කුකුළු ආදි සතුන් පිළිබද සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම | 100% | | |
| කාලීනව දෙපාර්තමේන්තුව මගින් පවරනු ලබන විවිධ සංගණන හා සමීක්ෂණ පැවැත්වීම | 100% | | |
| විවිධ රාජ්‍ය සහ පුද්ගලික ආයතන, පර්යේෂණ සහ පුද්ගලික ආදී අවශ්‍යතා සඳහා අවශ්‍ය දත්ත සකස්කිරීම, විශ්ලේෂණය සහ නිකුත් කිරීම | 100% | | |
| විවිධ පුහුණු කටයුතු | 100% | | |
| අන්තර්ජාල, පරිගණක, ටැබ්, මුද්‍රක, ප්‍රක්ෂේපක, ෆැක්ස්, දුරකථන ආදී විවිධ තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම | 100% | | |

### 4.1.9.දිස්ත්‍රික් ආපදා කළමනාකරණ අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ආපදා කළමණාකරණ දැනුවත් කිරීමේ වැඩසටහන් | මුලා ප්‍රතිපාදන නොලැබීම | | 36.36% |
| ආපදා පෙර සූදානම් සහ සැළසුම් සකස් කිරීමේ වැඩසටහන් | එම | | 18.18% |
| හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ කටයුතු | 100% | | |
| මහජන පැමිණිලි පරික්ෂාව සහ ආදාල ආයතන සම්බන්ධිකරණ කටයුතු | 100% | | |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන භූ පරික්ෂණ | 2025 නොවැම්බර් මස ඇතිවූ සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් ඇතිවූ හදිසි ආපදා තත්ත්වයට ප්‍රතිචාර දැක්වීම | | 72.38% |

### 4.1.10. ඉඩම් පරිහරණ සැලැසුම් අංශය (ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව)

| විශේෂිත දර්ශක | | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම, දත්ත හුවමාරුව හා ඉඩම් පරිහරණ සැලසුම්කරණය | 1.1 කෘෂි කාර්මික භූමි පරිහරණය සහිත ඉඩම් සඳහා කෘෂි වගා කළමණාකරණ පද්ධති වර්ගීකරණය කිරීම. | භෞතික100%<br>මූල්‍ය 100% | | |
| | 1.2 භූමි පරිහරණ වෙනස්වීම් හඳුනාගැනීමේ සමීක්ෂණය | භෞතික 100%<br>මූල්‍ය 100% | | |
| පස හා ජල සංරක්ෂණය තුලින් ඌන පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායිතාවය ඉහල නැංවීම | | භෞතික 100%<br>මූල්‍ය 100% | | |
| ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | | භෞතික 100%<br>මූල්‍ය 100% | | |
| ක්ෂුද්‍ර ජලපෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | | භෞතික 100%<br>මූල්‍ය 100% | | |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම | | භෞතික 100%<br>මූල්‍ය 100% | | |
| ප්‍රාදේශිය ඉඩම් පරිහරණ සැලසුම් | | භෞතික 100%<br>මූල්‍ය 100% | | |
| ප්‍රාදේශිය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු. | | භෞතික 100%<br>මූල්‍ය 100% | | |

### 4.1.11.බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරි

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් ගණන | 100% | | |
| දිස්ත්‍රික් සිල්මාතා සංගම් රැස්වීම් | 100% | | |
| දහම් පාසල් ගුරු විභාග | 100% | | |
| දහම් පාසල් ප්‍රාදේශිය සිසු නිපුණතා තරඟ | 100% | | |
| දිස්ත්‍රික් සිසු නිපුණතා තරඟ | 100% | | |

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| දහම් පාසල් පෙළ පොත් බෙදා දීම් | 100% | | |
| තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන | 100% | | |
| දහම් පාසල් ගුරු දීමනා | 100% | | |
| ඌණ සංවර්ධන දහම් පාසල් සංවර්ධනය කිරීම් | 100% | | |
| ඌණ සංවර්ධන ග්‍රාමීය විහාරස්ථාන සංවර්ධනය කිරීම් | 100% | | |
| දහම් සරසවි ඩිප්ලෝමා පාඨමාලාව | 100% | | |
| ගුරු සිසු ලේඛණ මුද්‍රණය කිරීම හා බෙදා දීම් | 100% | | |
| ආදාහන ආධාර | 100% | | |
| අනුනායක පදවි ප්‍රාප්ත උත්සවය | 100% | | |
| අනුනායක ස්වාමින් වහන්සේගේ ආදාහන පූජෝත්සවය උත්සවය | 100% | | |
| මත්නිවාරණ සම්පත්දායක පුහුණු වැඩසටහන් | 100% | | |
| මහනුවර හා මාතලේ බෞද්ධ කටයුතු නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් | 100% | | |
| දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන් | 100% | | |
| සම්පත්දායක පුහුණු වැඩසටහන් | 100% | | |
| දහම් පාසල් නිරීක්ෂණ කටයුතු | 100% | | |
| වෙසක් උත්සව වැඩසටහන් | 100% | | |
| පොසොන් උත්සව වැඩසටහන් | 100% | | |
| දළදා පෙරහැර | 100% | | |
| දළදා දැක්ම වැඩසටහන සංවිධානය | 100% | | |

### 4.1.12. ආගමික කටයුතු හා භාෂා අංශය/ සංවර්ධන නිලධාරි (හින්දුකටයුතු)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| හිංදු කෝවිල් ප්‍රතිසංස්කරණ,අලුත් වැඩියාව,හා සංවර්ධනය | 100% | | |
| හිංදු උත්සවය මුළු වැඩසටහන් | 100% | | |
| දහම් පාසල් ගුරු දීමනා | 100% | | |
| දත්ත තොරතුරු පද්ධතිය | 100% | | |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා දහම් අධ්‍යාපන වැඩසටහන් | 100% | | |
| හින්දු දහම් පාසල් දරුවන් සඳහා වන ජාතික නිර්මාණ කුසලතා සම්මාන තරඟය | 100% | | |
| හින්දු දහම් පාසල් ගරුවරුන් දරුවන් සඳහා ධර්මාචාර්ය සම්මන්ත්‍රණ | 100% | | |
| පුණ්‍ය ග්‍රම වැඩසටහන් | 100% | | |
| අන්තර් ආගමික සහජීවන වැඩසටහන් | 100% | | |

### 4.1.13. ආගමික කටයුතු හා භාෂා අංශය / සංවර්ධන නිලධාරි (ක්‍රිස්තියානි ආගමික කටයුතු)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ක්‍රිස්තියානු ආගමික පල්ලි / දහම් පාසල් සඳහා ආධාර වැඩි දියුණු කිරිම, අලුත්වැඩියා කටයුතු/ උපකරණ ලබාදීම් | 100% | | |
| ක්‍රිස්තියානු උත්සවය සම්බන්ධ මුළු වැඩසටහන් | 100% | | |
| ක්‍රිස්තියානි දහම් පාසල් ගුරු දීමනා | 100% | | |
| දත්ත තොරතුරු පද්ධතිය | | | |

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා දහම් අධ්‍යාපන වැඩසටහන් | 100% | | |
| ක්‍රිස්තියානු දහම් පාසල් දරුවන් සඳහා වන බයිබල් තරඟ | 100% | | |
| ක්‍රිස්තියානි දහම් පාසල් ගරුවරුන් දරුවන් සඳහා පවත්වන ලද ධර්මාචාර්ය සම්මන්ත්‍රණ | 100% | | |
| අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් | 100% | | |
| අන්තර් ආගමික සහජීවන වැඩසටහන් | 100% | | |

## 4.1.14. ආගමික කටයුතු අංශය - සංවර්ධන නිලධාරි (මුස්ලිම් ආගමික)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| මුස්ලිම් ආගමික පල්ලි/ දහම් පාසල් සඳහා ආධාර, වැඩි දියුණු කිරීම, අලුත්වැඩියා කටයුතු/ උපකරණ ලබාදීම. | 100% | | |
| මුස්ලිම් ආගමික උත්සව<br>උදා:- මිලාත් නබි, රාමසාන් | 100% | | |
| මුස්ලිම් දහම් පාසල් ගුරුවරුන් සඳහා ගුරු පුහුණු වැඩසටහන් | 100% | | |
| මුස්ලිම් දහම් පාසල් ගුරුවරුන් සඳහා ගුරු දීමනාව ලබා දීම් | 100% | | |
| මුස්ලිම් කලාකරුවන් සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් | 100% | | |
| මුස්ලිම් තරුණ තරුණියන් සඳහා ක්‍රියාත්මක කරන ලද මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 100% | | |
| අන්තර් ආගමික සහජීවන වැඩසටහන් | 100% | | |

## 4.1.15. සංස්කෘතික කටයුතු අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| සර්වාගමික වැඩසටහන් | 100% | | |
| දිස්ත්‍රික් ජාතික නිදහස් දින සැමරුම් උත්සවය | 100% | | |
| රාජ්‍ය කලාභූෂණ සම්මාන ප්‍රදානය | 100% | | |
| අගහිඟ කලාකරු ආධාර ගෙවීම් | 100% | | |
| කලායතන ආධාර | 100% | | |
| වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය | 100% | | |
| සංහිඳක සවිය | 100% | | |

## 4.1.16. ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ත්‍රෛභාෂා නාමපුවරු සකස් කරන ලද කාර්යාල ගණන | 100% | | |
| රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව රජයේ නිලධාරින් දැනුවත් වූ රජයේ නිලධාරින් සංඛ්‍යාව | 94% | | |
| පැය 100 දෙමළ භාෂා පාඨමාලාව හැදෑරූ නිලධාරින් ගණන | 100% | | |
| පැය 150 දෙමළ භාෂා පාඨමාලාව හැදෑරූ නිලධාරින් ගණන | 100% | | |
| ක්‍රියාත්මක කරන ලද පැය 100 දෙමළ භාෂා පාඨමාලා සංඛ්‍යාව හා සහභාගී වූ සංඛ්‍යාව | 100% | | |
| ක්‍රියාත්මක කරන ලද පැය 150 දෙමළ භාෂා පාඨමාලා සංඛ්‍යාව | 100% | | |
| කතෝලික පල්ලිය, හින්දු ,කෝවිල, ඉස්ලාම් පල්ලිය මූලිකව | 100% | | |

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| පවත්වන ලද ආගමික සහජීවන වැඩසටහනට සහභාගී වූ සංඛ්‍යාව | | | |
| රාජ්‍ය භාෂා දිනය හා සතියට සමගාමීව “රාජ්‍ය භාෂා පාසල් දිනය සැමරීම” | 100% | | |
| ජාතික භාෂා ඇගයීම් පරීක්ෂණ (NLQ Exam) පිළිබඳව රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | 100% | | |
| රාජ්‍ය භාෂා දිනය හා සතියට සමගාමීව පාසල් දිනය සහ යොවුන් දිනය සැමරීමේ වැඩසටහන් සඳහන් සහභාගී වූ ළමුන් සංඛ්‍යාව | 100% | | |
| රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය උදෙසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ගණන | 100% | | |

### 4.1.17. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම් | | |
|---|---|---|---|
